# (එ) විදේශීය වෙළෙඳාම

## පොදු උපනතීන්

1967 වර්ෂය තුළ දී ප්‍රති අපනයන යන් ද ඇතුළත් වූ අපනයන අගය රු.පි. දශ ලක්ෂ 1690 ක් වූ අතර, ආනයන වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 1738 ක් විය. මෙහි ප්‍රතිඵලය, භාණ්ඩ වෙළෙඳමෙන් වූ හිඟය රුපියල් දශ ලක්ෂ 48 ක් වීම යි.

1963 දී පත් වුනු පහත් මට්ටමින් නියත වශයෙන් දියුණු වෙමින් පැවැතියත්, 1966 දී රුපියල් දශ ලක්ෂ 249 කින් සීඝ්‍ර ලෙස අඩු විය. 1966 වර්ෂයේ දී ලංකාවේ අපනයන වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 1690 ක් විය. මේ වූකලී 1966 මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 10 ක නැතහොත් සියයට 0.6 ක අඩුවීමක් වන අතර, 1957 න් පසු සඳහන් වී ඇති අඩු ම සංඛ්‍යාව විය.

1966 දී රුපියල් දශ ලක්ෂ 554 කින් නැතහොත්, 1965 ප්‍රමාණයට වඩා සියයට 38 කින් සීඝ්‍ර ලෙස වැඩි වූ ආනයන වල වටිනාකම 1967 දී රුපියල් දශ ලක්ෂ 290 කින් නැතහොත් ඉකුත් වර්ෂයට වඩා සියයට 14 කින් සැලකිය යුතු අන්දමින් අඩු වී රුපියල් දශ ලක්ෂ 1738 ක් විය.[1]

ලංකාවේ විදේශීය වෙළෙඳාම සම්බන්ධ තොරතුරු රේගු වාර්තා වල සටහන් වී ඇති අයුරින්, (එ) 1 වැනි සංඛ්‍යා සටහනෙහි සපයා ඇත.

### සංඛ්‍යා සටහන II (ඒ) I

### විදේශීය වෙළෙඳාම 1960-1967

| වර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | දර්ශක අංක (1958) = 100) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රමාණය | | මිල | | | |
| | අපනයන * (නැ.වි.ස.) | ආනයන (මි ර.ගැ) | වෙළෙඳ ශේෂය | මුළු අපනයන | මුළු ආනයන | මුළු අපනයන | මුළු ආනයන | වෙළෙඳ අනුපාතය | අපනයන වල ක්‍රය ශක්තිය |
| 1960 | 1,832 | 1,960 | − 128 | 103 | 113 | 104 | 102 | 102 | 105 |
| 1961 | 1,733 | 1,703 | + 30 | 107 | 91 | 95 | 101 | 94 | 101 |
| 1962 | 1,808 | 1,660 | + 148 | 115 | 92 | 93 | 95 | 98 | 113 |
| 1963 | 1,731 | 1,490 | + 241 | 111 | 79 | 93 | 105 | 89 | 98 |
| 1964 | 1,876 | 1,975 | − 99 | 119 | 105 | 93 | 107 | 86 | 105 |
| 1965 | 1,949 | 1,474 | + 475 | 125 | 77 | 95 | 109 | 88 | 106 |
| 1966 | 1,700 | 2,028 | − 328 | 114 | 107 | 90 | 119 | 76 | 85 |
| 1967 | 1,690 | 1,738 | − 48 | 119 | 85 | 85 | 123 | 69 | 80 |

මූලය: ලංකා රේගු වාර්තා
ශ්‍රී ලංකා මහ බැංකුව

* ප්‍රති අපනයන ඇතුළුව

1. මුළු ආනයනයන් පිළිබඳ වූ සංඛ්‍යා තොරතුරු සම්බන්ධයෙන් පැවසූ අවවාදාත්මක වචනය නැවතත් සිහිපත් කළ යුතුව තිබේ. 1963, 1964 සහ 1965 වර්ෂයන් පිළිබඳ වූ වාර්ෂික වාර්තාවන්හි දක්වූ පරිදි ආනයන භාණ්ඩ රේගුවෙන් ඉවත් කිරීමත්, ඒ බව රේගු වාර්තා වල ලේඛන ගතවීමත් අතර සැලකිය යුතු කාල පරතරයක් ඇතිවිය හැකි නියා ඇත්ත වශයෙන් ආනයනය කළ භාණ්ඩයන්ගේ වටිනාකමෙහිත් එම කාල සීමාව තුළ රේගුවෙන් ඉවත් කළ බවට වාර්තා වල සඳහන් වන භාණ්ඩයන්ගේ වටිනාකමෙහිත් වෙනසක් ඇති විය හැකිය. මේ සලකා බැලීම.විශේෂයෙන් රජයේ ආනයන වලටත් එයිනුත් විශේෂයෙන් ම මුළු ආනයනයන්ගෙන් සැලකිය යුතු සමානුපාතයක් වන සහල්, කිරිහු පිටි සහ සීනි වලටත් අදළ වෙයි. මෙම භාණ්ඩයන් තුන පිළිබඳව රේගු වාර්තා වල එන සංඛ්‍යා විස්තර හා ඇත්ත වශයෙන් කරන ලද ආනයනයන් අතර ඇති වෙනස හා ඒවායේ ආනයනයන් පිළිබඳව මතු ඡේදයක තරමක් දුරට සාකච්ඡා කරනු ඇත.

1966 දී විෂම අන්දමින් පහත වැටුනු, අපනයන වල මුළු ප්‍රමාණය 1967 වර්ෂයේ දී ඉහල ගොස් ඇත. මහ බැංකුවේ අපනයන පරිමා දර්ශකය (1958 = 100) 114 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සියයට 4 කින් වැඩිවීමක් දක්වයි. 1965 දී සුළු වශයෙන් දියුණුවක් පෙන් වූ සියළු අපනයනයන්ගේ සාමාන්‍ය මිළ, 1966 දී සියයට 5 කින් පහළ වැටිණි. 1967 වර්ෂයේ දී මෙම පිරිහීමේ උපනතිය නොකඩවා පැවැති අතර, සියළු අපනයනයන්ගේ සාමාන්‍ය මිල, 1966 මට්ටමට වඩා සියයට 6 කින් තවත් පහළ වැටිණි. එහෙයින්, 1967 වර්ෂයේ අපනයන ඉපැයුම් පහළ වැටීම, අපනයනයන්ගේ සාමාන්‍ය මිලෙහි පිරිහීම හේතු කොට ගෙන සිදු වූවකි. අපනයන පරිමාවේ වැඩි වීමෙන් මෙහි ප්‍රතිවිපාක තරමක් දුරට මැකුණි.

ඉකුත් වර්ෂයන් සසඳ බලන කළ 1965 ආනයන ප්‍රමාණය (මහ බැංකුවේ වෙළෙඳ දර්ශකයෙන්, මැණෙන ආකාරයට පාද (1958 = 100) සාපේක්ෂක වශයෙන් පහළ මට්ටමක පැවතුණි. 1966 වර්ෂයේ දී ආනයන පරිමාවේ තියුණු වැඩි වීමක් දක්නට තිබුණු අතර, 1967 දී මෙම ප්‍රවනතාවය ප්‍රතිවිරුද්ධ අතට හැරුනි. සමාහාර පරිමා දර්ශකය 85 ක් (පාද 1958 = 100) වූයෙන් 1966 ට වඩා සියයට 21 ක පිරිහීමක් දක්වුනි. සියළුම ආනයන වල සාමාන්‍ය මිළ 1962 සිට සීඝ්‍ර ලෙස ඉහළ යමින් පැවති අතර, 1967 වර්ෂය තුළ දී ද ඉහළ යෑමේ උපනතිය නොකඩවා පැවතිණි. මහ බැංකුවේ, සියළු ආනයන දර්ශකය 123 ක් වූයෙන් ඉකුත් වර්ෂයට වඩා සියයට 3 ක වැඩි වීමක් දක්විනි. එහෙයින් 1967 දී ආනයන අගය සීඝ්‍ර ලෙස අඩුවීම ප්‍රධාන වශයෙන්ම ආනයන පරිමාවේ කැපී පෙනෙන අඩුවීම හේතු කොට ගෙන සිදු වූවකි. ආනයන වල සාමාන්‍ය මිලෙහි වැඩිවීම හේතු කොට ගෙන මෙසේ පරිමාව අඩුවීමේ ප්‍රතිඵලය වුවමනාවටත් වඩා කැපී ගියේය.

1962 සිට පිරිහෙමින් පැවති ලංකාවේ විදේශීය වෙළෙඳ අනුපාතය 1965 දී (මහ බැංකුවේ වෙළෙඳ දර්ශකයෙන් මැනෙන අයුරු) සුළු වැඩිවීමක් දක් විය· 1966 දී මෙම තාවකාලික ප්‍රවනතාවය අනෙක් අතට හැරුණු අතර, විදේශීය වෙළෙඳ අනුපාතිකය සියයට 13කින් තියුණු ලෙස පහළ වැටිණි. 67 (1966) සිට 69 (1967) දක්වා එනම් ඉකුත් වර්ෂයේ මට්ටමට වඩා සියයට 9 කින් පිරිහුනු විදේශීය වෙළෙඳ අනුපාතිකය 1967 වර්ෂය තුළදීද දිගටම පිරිහෙමින් පැවතුනි.

1964 වර්ෂය තුළ දී කැපී පෙණෙන වැඩි වීමක් දක් වූ අපනයන වල ක්‍රය ප්‍රතිශක්තිය එනම්, $\frac{\text{අපනයන වටිනාකම}}{\text{ආනයන පරිමාව දර්ශකය}} \times 100$, 1965 දී ද, වැඩි වෙමින් පැවතුනි. 1966 දී මෙම ප්‍රවනතාවය එම වර්ෂයේ දී අනෙක් අතට හැරුනෙන්, අපනයන වල ක්‍රය ශක්තිය සියයට 20 කින් පහළ වැටුණි. මෙම ප්‍රවනතාවය 1967 දී ද දිගට ම පැවතුනු හෙයින් දර්ශකය 1966 මට්ටමට වඩා සියයට 6 කින් පහළ වැටුණි.

රේගු වාර්තා වල සඳහන් වි ඇති මුළු ආනයන සංඛ්‍යා, 1967 වර්ෂය තුළ දී නියත වශයෙන් ම ලැබී ඇති ආනයන වල වටිනාකම අඩු කොට දක්වයි. 1966 වර්ෂයේ දී ආනයන කොට ඇති සහල්, පිටි සහ සිනි ආදියෙහි ප්‍රමාණය ආහාර කොමසාරිස් වරයා විසින් නීත්‍ය ලෙස ආනයනය කොට ඇති එම ද්‍රව්‍ය වල ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 121 ක් වැඩියෙන් රේගු වාර්තා වල සටහන් වී ඇති අතර, 1967 දී ආනයනය කොට ඇති මෙම ද්‍රව්‍ය වල ප්‍රමාණය ආහාර කොමසාරිස් වරයාගේ සංඛ්‍යා වලට වඩා රුපියල් දශ ලක්ෂ 35 කින් අඩුව රේගු වාර්තා වල සටහන් වී ඇත.

රේගු වාර්තා වල සටහන් වී ඇති, 1966 සහ 1967 වර්ෂ වල මුළු ආනයන ප්‍රමාණ ආහාර කොමසාරිස් වරයා වෙත නියම වශයෙන් ලැබී ඇති මුළු ආනයන ප්‍රමාණය දිස්වීමට නැවත සකස් කළහොත්, 1966 ආනයනවල වටිනාකම රුපියල්

දශ ලක්‍ෂ 2028 සිට රුපියල් දශ ලක්‍ෂ 1907 දක්වා අඩු වන අතර, 1967 ආනයන වල වටිනාකම රුපියල් දශ ලක්‍ෂ 1738 සිට රුපියල් දශ ලක්‍ෂ 1773 දක්වා වැඩි වනු ඇත. මේ පදනම අනුව,[1] 1967 ආනයන වල වටිනාකම ඉකුත් වර්‍ෂයේ මට්ටමට වඩා රුපියල් දශ ලක්‍ෂ 134 කින් නැතහොත් සියයට 7 කින් පහළ බැස ඇත.

රේගු වාර්තා වල සඳහන් වී ඇති ආකාරයට, 1967 දී වෙළෙඳ ශේෂයෙහි රුපියල් දශ ලක්ෂ 48 ක හිඟයක් නිරූපනය වන අතර, 1966 දී එම හිඟය රුපියල් දශ ලක්ෂ 328 ක් විය. ගලපන සංඛ්‍යා තොරතුරු අනුව, 1966 භාණ්ඩ වෙළෙඳ ශේෂයෙහි හිඟය රුපියල් දශ ලක්ෂ 207 කින් අඩු වන අතර, 1967 හිඟය රුපියල් දශ ලක්ෂ 83 කින් වැඩිවනු ඇත.

## අපනයන

මුළු අපනයන වටිනාකමෙහි අඩුවීමට සම්පූර්ණයෙන් හේතු වූයේ, ප්‍රධාන අපනයන නිෂ්පාදන තුනෙහි සාමාන්‍ය නැ. වි ස. මිල තියුණු ලෙස අඩුවීමයි. 1967 දී මුළු අපනයන ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 10 කින් අඩුවිය. මෙය ප්‍රධාන වශයෙන් ම රබර් අපනයනයෙන් ලද ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 55 කින් ද, ප්‍රධාන පොල් නිෂ්පාදන තුනෙන් ලද ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 29 කින් ද පහළ වැටුනු නිසාය. එහෙත්, එහි බලපෑම, තේ හා සුළු අපනයන නිෂ්පාදන සහ ප්‍රති නිෂ්පාදන වලින් ලද අපනයන ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 74 කින් වැඩි වූ හෙයින් තරමක් දුරට මැකිනි. අපනයන වල සැකැසුම ද මුළු අපනයන ඉපැයීම් වලින් ප්‍රතිශත කොටස් වශයෙන් ඒවායේ වැදගත් කම ද 11 (එ) 2 වැනි සංඛ්‍යා සටහනින් පෙන්වා දී ඇත.

### සංඛ්‍යා සටහන II (ඒ) 2

### අපනයන සැකසුම

| භාණ්ඩ | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | | | | මුළු අපනයන් වලින් සියයට ගණන | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 |
| තේ .. | 1,149 | 1,140 | 1,148 | 1,210 | 1,027 | 1,061 | 64 | 66 | 61 | 62 | 60 | 63 |
| රබර් .. | 290 | 257 | 290 | 304 | 337 | 282 | 16 | 15 | 15 | 16 | 20 | 17 |
| ප්‍රධාන පොල් නිෂ්පාදන තුන | 227 | 198 | 273 | 275 | 196 | 167 | 13 | 11 | 15 | 14 | 12 | 10 |
| එහි සැදුමන් | | | | | | | | | | | | |
| (අ) කොප්පරා .. | 55 | 39 | 55 | 49 | 25 | 18 | 4 | 2 | 3 | 3 | 2 | 1 |
| (ආ) පොල් තෙල් .. | 112 | 99 | 154 | 144 | 108 | 88 | 6 | 6 | 8 | 7 | 6 | 5 |
| (ඉ) කපාපු පොල් .. | 56 | 60 | 64 | 82 | 63 | 61 | 3 | 3 | 4 | 4 | 4 | 4 |
| අනෙකුත් දේශීය අපනයන . | 100 | 110 | 137 | 127 | 116 | 121 | 5 | 6 | 7 | 6 | 7 | 7 |
| මුළු දේශීය අපනයන .. | 1,766 | 1,705 | 1,842 | 1,916 | 1,676 | 1,631 | 98 | 98 | 98 | 98 | 99 | 97 |
| ප්‍රති අපනයන .. | 42 | 26 | 34 | 33 | 24 | 59 | 2 | 2 | 2 | 2 | 1 | 3 |
| එකතුව .. | 1,808 | 1,731 | 1,876 | 1,949 | 1,700 | 1,690 | 100 | 100 | 100 | 100 | 100 | 100 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1967 දී තේ වලින් ලද අපනයන ඉපැයීම්, 1966 ඉපැයීම් වලට වඩා රුපියල් දශ ලක්ෂ 34 කින් නැතහොත් සියයට 3 කින් වැඩි විය. ඉපැයුම් වැඩිවීමට මුළුමනින්ම හේතු වූයේ අපනයන පරිමාව වැඩි වීමය. 1967 දී අපනයනය කරන ලද තේ වල ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 478 ක් වූ අතර, මේ වූකලී 1966 දී අපනයනය කරන ලද ප්‍රමාණයට වඩා රාත්තල් දශ ලක්ෂ 37 ක නැතහොත්, සියයට 8 ක වැඩි වීමකි. ඉකුත් වර්‍ෂයේ දී සිදු අන්දමින් පහළ වැටුනු

1 1966 දී භාණ්ඩ වෙළෙඳාමෙන් වූ සැහෙන හිඟය සම්බන්ධව විස්තරයක් එම වර්ෂයට අදළ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ 152 වැනි පිටුවේ 1 වැනි ඡේදයේ පළ වේ.

තේ වල නැ. වි. ස. මිල මේ වර්ෂයේ දී තවත් පහළ වැටුනෙන්, තේ රාත්තලක් රු. 2.22 ක් විය. මේ වූකලී 1966 දීට වඩා සත 11 ක නැතහොත් සියයට 5 ක අඩු වීමකි. මුළු අපනයන වලින් තේ වල කොටස සියයට 63 ක් වූ අතර, මෙය පසුගිය වර්ෂයට වඩා සියයට 3 කින් වූ වැඩිවීමකි.

අනෙක් අතට, රබර් වලින් ලද අපනයන ඉපැයීම්, 1966 වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 55 කින්, හෙවත් සියයට 16 කින්, පහළ වැටුණි. 1967 දී රබර් රාත්තලක නැ. වි. ස. මිල සත 97 දක්වා සහ 16 කින් සීඝ්‍ර ලෙස පිරිහීම මෙයට ප්‍රධාන හේතුව විය. අපනයන කරන ලද රබර් ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 7 කින්, හෙවත්, සියයට 2 කින් සංකෝචනය වීම හේතු කොට ගෙන අපනයන වල වටිනාකම කෙරෙහි බල පෑ මිල පහත වැටීමේ ප්‍රතිවිපාක තවත් බලවත් විය. 1967 දී අපනයන කරන ලද රබර් ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 291 ක් විය.[1] ඉකුත් වර්ෂයේ දී, මුළු අපනයන ඉපැයීම් වලින් සියයට 20 ක් වූ රබර් වල කොටස, සියයට 17 දක්වා පහළ වැටුණි.

ප්‍රධාන පොල් නිෂ්පාදන තුනෙන් ලද අපනයන ඉපැයීම්, ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 29 කින් හෙවත් සියයට 15 කින් පහළ වැටුණි. මෙම පිරිහීමට හේතු වූයේ, ඒවායේ මුළු අපනයන පරිමාව සියයට 8 කින් ද, ඒවායේ සාමාන්‍ය මිල (මහ බැංකුවේ වෙළෙඳ දර්ශකයන්ගෙන් මැනෙන ආකාරයට) සියයට 6 කින් ද, පහළ වැටීම ය. 1966 දී මුළු අපනයන ඉපැයීම් වලින් සියයට 12 ක් වූ මෙම නිෂ්පාදන කොටස, මේ වර්ෂයේ දී සියයට 10 දක්වා පිරිහී ඇත.

අනෙකුත් දේශීය අපනයන වලින් ලද ඉපැයීම 1966 දී රුපියල් දශ ලක්ෂ 11 කින් හෙවත් සියයට 9 කින් පහළ ගිය අතර, 1967 දී රුපියල් දශ ලක්ෂ 5 කින් හෙවත් සියයට 4 කින් වැඩි විය. අපනයන කරන ලද කොහු කෙඳි වලින් ලද ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 3 කින් හෙවත් සියයට 8 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 41 ක් වූ අතර, මෙම වැඩිවීමට හේතු වී ඇත්තේ අපනයන පරිමාවෙහි වූ සියයට 8 ක සහ නැ. වි. ස. සාමාන්‍ය මිලෙහි වූ සියයට 6 ක වැඩිවීමය. බුරුසු කෙඳිවල නැ.වි.ස. සාමාන්‍ය මිල සියයට 6 කින් පහළ වැටුණු අතර, ගුදිර කෙඳි වල මිල මද වශයෙන් වැඩි වුණි. රුපියල් දශ ලක්ෂ 31 ක් වූ කුරුඳු අපනයන වටිනාකමෙහි රුපියල් දශ ලක්ෂ 1 ක හෙවත් සියයට 33 ක වැඩිවීමක් පළ වූ අතර, මෙම වැඩිවීමට මුළු මනින් ම හේතු වී ඇත්තේ අපනයන ප්‍රමාණය සියයට 12 කින් වැඩි වීමය. ඒ අතර, කුරුඳු වල නැ. වි. ස. සාමාන්‍ය මිල සියයට 9 කින් පහළ වැටුණි. කොකෝවා අපනයන ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 4 ක් වූ අතර, මේ වූකලී ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 2 ක නැතහොත් සියයට 33 ක පිරිහීමකි. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අපනයන ප්‍රමාණය සියයට 46 කින් පහළ වැටීම වූ අතර, නැ. වි. ස. සාමාන්‍ය මිලෙහ වූ සියයට 28 ක වැඩිවීමෙන් එහි ප්‍රතිවිපාක තරමක් දුරට මැකුණි. මිනිරන් වලින් ලද අපනයන ඉපැයීම් රුපියල් දශ ලක්ෂ 1 කින්, නැතහොත් සියයට 17 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 7 ක් වූ අතර, අපනයන ප්‍රමාණය සියයට 4 කින් ද නැ.වි.ස. මිල සියයට 5 කින් ද වැඩිවීම මෙයට හේතු විය. ඉකුත් වර්ෂ දෙකෙහි දී පිරිහෙමින් පැවති ප්‍රති අපනයන වල වටිනාකම 1967 දී කැපී පෙනෙන පරිදි වැඩි වී රුපියල් දශ ලක්ෂ 59 ක් විය. මෙය ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 35 කින් වූ වැඩිවීමකි. මෙම වැඩි වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ අපනයන කරන ලද බන්කර ප්‍රමාණය ප්‍රාසාරණ වීමෙන් ඇති වූ රුපියල් දශ ලක්ෂ 32 ක වැඩි වීමකි.

---

1 1967 දෙසැම්බර් මසින් අවසන් වූ මාස දොළහ තුළ නියම වශයෙන් නැව් වලට පටවන ලද මුළු රබර් ප්‍රමාණය රාත්තල් 29,89,45,207 ක් විය.

තේ

1967 දී තේ නිෂ්පාදනය රාත්තල් දශ ලක්ෂ 487 ක් විය. මෙය 1966 දී නිපදවන ලද ප්‍රමාණයට වඩා රාත්තල් දශ ලක්ෂ 3·4ක් නැතහොත් සියයට 0·7 කින් අඩු ය. කෙසේ වෙතත්, රාත්තල් දශ ලක්ෂ 503 ක් වූ 1965 දී නිපදවන ලද ප්‍රමාණය හා සසඳන විට, 1967 තේ නිෂ්පාදනය රාත්තල් දශ ලක්ෂ 16 කින් නැතහොත්, සියයට 3 කින් පහළ බැස ඇත. 1967 දී තේ නිෂ්පාදනය පහත මට්ටමකට වැටීමට, හේතු වී ඇත්තේ, අවුරුද්දේ මුල් මාස කිහිපය තුළ පැවති අයහපත් කාල ගුණය සහ තේ නිෂ්පාදනය, ඉස්තරම් වගීයේ තේ නිපදවීමට යොමු කරවීමය. විශේෂයෙන් ම උඩරට සහ මැද රට කොටස් හි සිදු වී ඇති නිෂ්පාදනයන් සඳහා වඩා හොඳ මිලක් ලබා ගැනීමට ලා දළු නෙළීම කෙසේ වෙතත්, නිෂ්පාදනය ඉස්තරම් වර්ගයනට විතැන් කිරීමෙන් නිෂ්පාදන මිලෙහි පිරිහීම වැළැක්වීමට නො හැකි විය. මුළු නිෂ්පාදන ප්‍රමාණයෙහි පිරිහීමට හේතුවූ තවත් කරුණක් නම්, අාන්තික නිමැවුම් කරුවන් කෙරෙහි බලපෑ මිල පහළ බැසීමය. මෙම නිරීක්ෂණය නිත්‍ය ලෙස ඔප්පු කිරීමට නොහැකි වුවද, නොනැවති පැවතුන අඩු මිලෙහි බලපෑම විශේෂයෙන් පහත රට වතුවල නිෂ්පාදනයෙහි සංකෝචනයකට තුඩු දුන්නේ යැයි නිගමනය කිරීම තර්කානුකූලය. නිෂ්පාදනයේ පිරිහීම උඩරට සහ පහත රට තේ වගාවලට සීමා වූ අතර, මෙම තේ වල නිමැවුම පිළිවෙලින් රාත්තල් දශ ලක්ෂ 9.0 කින් සහ රාත්තල් දශ ලක්ෂ 6.6 කින් පහළ වැටුණි. මැදරට තේ නිෂ්පාදනය රාත්තල් දශ ලක්ෂ 12·1 කින් වැඩි විය. නිෂ්පාදනය, අපනයන, කොළඹ වෙන්දේසියට ඉදිරිපත් කළ ප්‍රමාණය, ලංඩන් වෙන්දේසිය සඳහා කෙළින් ම එක්සත් රාජධානිය වෙ යැවූ ප්‍රමාණය සහ පුද්ගලික ගිවිසුම් යටතේ විකුණූ ප්‍රමාණය සම්බන්ධ සංඛ්‍යා තොරතුරු 11 (එ) 3 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

### සංඛ්‍යා සටහන II (එ) 3

### නිෂ්පාදනය, අපනයනය හා කොළඹ වෙන්දේසියේ විකුණූ තේ ප්‍රමාණය සහ ලංඩන් වෙන්දේසි වලට නැව්ගත කරන ලද ප්‍රමාණයන්

රාත්තල් දශ ලක්ෂ

| වර්ෂය | නිෂ්පාදනය | අපනයන | | කොළඹ වෙන්දේසියේ විකුණු ප්‍රමාණය | කෙළින්ම ලංඩනයට නැව්ගත කැරුන ප්‍රමාණය | පුද්ගලික විකිණීම† |
|---|---|---|---|---|---|---|
| | | රේගු සංඛ්‍යා | නියම | | | |
| 1965 .. | 503 | 495 | 474 | 368 | 125 | – |
| 1966 .. | 490 | 441 | 441 | 359 | 108 | – |
| 1967 .. | 487 | 478 | 460 | 369 | 110 | 5 |

මූලය: තේ පාලන තැනගේ පාලන වාර්තා,
ලංකා රේගු වාර්තා,
කොළඹ තේ බ්‍රෝකර්වරුන්ගේ සංගමය.

† පුද්ගලික තේ විකිණීම ක්‍රියාත්මක වූයේ 1967 මාර්තු මස 1 වැනිද ය. මෙම විකිණීම, ඇ. එ. ජ. හා කැනඩාවට පමණක් සීමාවිය.

1967 දී අපනයනය කරන ලද තේ ප්‍රමාණය 1966 ප්‍රමාණයට වඩා රාත්තල් දශ ලක්ෂ 37 කින් නැතහොත් සියයට 8 කින් වැඩි විය. කොළඹ වෙන්දේසියේ විකුණන ලද ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 10 කින් නැතහොත් සියයට 3 කින්ද, ලංඩන් වෙන්දේසිය සඳහා එක්සත් රාජධානිය වෙත කෙළින්ම යවන ලද ප්‍රමාණය

රාත්තල් දශ ලක්ෂ 2 කින් නැතහොත් සියයට 2 කින් ද වැඩිවීමෙන් මෙම ප්‍රාසාරණය පිළිබිඹු වෙයි. පුද්ගලික විකිණීම් මගින් තේ රාත්තල් දශ ලක්ෂ 5 ක් විකුණන ලදී. 1966 සැප්තැම්බර් මස අග දී රාත්තල් දශ ලක්ෂ 59 ක්වූ ලංකාවේ පැවැති නිෂ්පාදිත තේ තොග, 1967 සැප්තැම්බර යේදී රාත්තල් දශ ලක්ෂ 40 දක්වා පහළ වැටී ඇති බව දූනට ඇති සංඛ්‍යා තොරතුරු වලින් දක්වේ.[1]

## කොළඹ වෙන්දේසි

1966 මුල දී පටන්ගත් තේ මිලෙහි පිරිහීම, වර්ෂය තුළ දී නොකඩවා පැවති අතර, 1967 දෙවන භාගයේ දී තව දුරටත් වැඩියෙන් සිදු විය. තුන් වන කාර්තුවේදී පහත රට තේ වල මිල පිරිහෙමින් පැවති අතර, උඩ රට සහ මැද රට තේ වල මිලෙහි, සුළු වැඩිවීමක් සටහන් විය. කෙසේ වෙතත් තේ වර්ග තුනේම මිලෙහි සැලකිය යුතු වැඩි වීමක්, හතර වෙනි කාර්තුවේදී දක්නට තිබිනි. වෙළෙඳ මිලෙහි වූ මෙම වැඩිවීමට හේතුව වශයෙන් තරමක් දුරට 1967 නොවැම්බර් මස 22වැනි දින ලංකා රුපියලේ මිල අවප්‍රමාණ කිරීම් දක්විය හැකිය. කොළඹ වෙන්දේසියේ විකුණනු ලැබූ තේ වල සාමාන්‍ය ශුඩ මිල 1966 දී රාත්තලකට සත 18 කින්, නැතහොත් සියයට 10 කින් තරම් විශාල ප්‍රමාණයකින් අඩු වුන අතර, 1967 දී රාත්තලකට තවත් සත 7 කින් නැතහොත් සියයට 4 අඩුවීමක් වූයෙන්, රාත්තලක මිල රුපියල් 1.50 ක් විය. මිලෙහි මෙම පිරිහිම උඩරට සහ පහත රට තේ වගීයන්ට සීමා වූ අතර, මැද රට තේ වල මිලෙහි රාත්තලකට සත 1 ක මඳ වැඩිවීමක් සටහන් විය. උඩරට සහ පහත රට වගීයන්ගේ මිල පිරිහිම් ප්‍රමාණයෙහි කැපී පෙනෙන වෙනස්කම් තිබුණි. පහත රට තේ වල මිල 1966 පැවති මට්ටමට වඩා රාත්තලක ට සත 17කින් නැතහොත් සියයට 12 කින් සීඝ්‍ර ලෙස පහත වැටී රාත්තලක් රුපියල් 1.20 ක් වූ අතර, උඩරට තේ වල මිල රාත්තලකට සත 2 කින්, නැතහොත් සියයට 1 කින් අඩු වී රාත්තලක් රු. 1.82 ක් විය. 11 (එ) 4 වැනි සංඛ්‍යා සටහ-නෙහි, තේ නිෂ්පාදනය, අපනයන සහ මිල ගණන් දක්වේ.

### සංඛ්‍යා සටහන II (එ) 4

### තේ නිෂ්පාදනය, අපනයනය සහ මිල

| වර්ෂය | | නිෂ්පාදනය | අපනයන | | කොළඹ වෙන්දේශියේ රාත්තලක මිල සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ | ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ | රාත්තලක නැ·වි·ස· මිල රු. සත | උඩරට වගාව | මැදරට වගාව | පහතරට වගාව | සියළුම තේ වර්ග |
| 1960 | .. .. | 435 | 410 | 2·67 | 2·03 | 1·75 | 1·83 | 1·88 |
| 1961 | .. .. | 455 | 426 | 2·62 | 1·99 | 1·72 | 1·74 | 1·83 |
| 1962 | .. .. | 467 | 452 | 2·54 | 2·02 | 1·61 | 1·56 | 1·75 |
| 1963 | .. .. | 485 | 456 | 2·50 | 1·90 | 1·54 | 1·53 | 1·68 |
| 1964 | .. .. | 482 | 456 | 2·51 | 1·93 | 1·58 | 1·49 | 1·68 |
| 1995 | .. .. | 503 | 495 | 2·45 | 1·93 | 1·66 | 1·64 | 1·75 |
| 1966 | .. .. | 490 | 441 | 2·33 | 1·84 | 1·46 | 1·37 | 1·57 |
| 1967 | . | 487 | 478 | 2·22 | 1·82 | 1·47 | 1·20 | 1·50 |
| 1966 | 1 වැනි කාර්තුව .. | 129 | 111 | 2·42 | 2·04 | 1·61 | 1·62 | 1·76 |
| | 2 වැනි කාර්තුව .. | 146 | 135 | 2·40 | 1·70 | 1·39 | 1·40 | 1·50 |
| | 3 වැනි කාර්තුව .. | 97 | 119 | 2·24 | 1·79 | 1·43 | 1·27 | 1·50 |
| | 4 වැනි කාර්තුව .. | 118 | 76 | 2·20 | 1·82 | 1·46 | 1·15 | 1·48 |
| 1967 | 1 වැනි කාර්තුව .. | 116 | 121 | 2·31 | 1·89 | 1·46 | 1·10 | 1·48 |
| | 2 වැනි කාර්තුව .. | 143 | 118 | 2·17 | 1·66 | 1·33 | 1·04 | 1·34 |
| | 3 වැනි කාර්තුව .. | 104 | 137 | 2·10 | 1·80 | 1·44 | 1·20 | 1·48 |
| | 4 වැනි කාර්තුව .. | 124 | 102 | 2·34 | 1·97 | 1·70 | 1·49 | 1·72 |

මූලය: තේ පාලක තැනගේ වාර්තා,
ලංකා රේගු වාර්තා
කොළඹ තේ බ්‍රෝකර් වරුන්ගේ සංගමය.

1. 1967 පෙබරවාරි සහ මාර්තු මාසවල ෆොබ්ස් සහ වොකර් වෙළෙඳ වාර්තා

1967 තුළ දී කොළඹ වෙන්දේසියට ඉදිරිපත් කළ තේ ප්‍රමාණය අධික වී මෙන්, කොළඹ වෙන්දේසියේ විකුණනු ලැබූ ප්‍රමාණය ඉකුත් වර්ෂයේ විකුණන ලද ප්‍රමාණයට වඩා රාත්තල් දශ ලක්ෂ 10 කින් වැඩි විය. ඉරාකය හා සෝ.ස.ස.සං. විසින් අඩුවෙන් මිල දී ගැනීම වෙළෙඳ පොලේ මිල පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

1966 මුල් කාර්තුව හා සසඳන කල උඩරට තේ වල සාමාන්‍ය ශුඛ මිල 1967 අනුරූප කාර්තුවේ දී රාත්තලකට සත 15 ක පිරිහීමක්ද දක්විය. දිඹුල/දික්ඔය සෘතුව අවසන්වීමත් සමග, 1967 දෙ වැනි කාර්තුවේ දී කලින් කාර්තුවට වඩා සත 23 කින්ද, 1966 අනුරූප කාර්තුවට වඩා සත 4 කින් ද අඩුවී රාත්තලක මිල රු. 1·66 ක් විය. 1967 තුන් වැනි කාර්තුවේ දී උස්බිම් වල වගා කළ තේ වල මිල යහපත් අතට හැරුණු අතර, රාත්තලක මිල රු. 1.80 ක් විය. මේ වූකලී ඉකුත් වර්ෂයේ අනුරූප කාර්තු වලට වඩා රාත්තලකට සත 1 කින් වූ වැඩි වීමකි. අන්තිම කාර්තුවේ දී මිල ගණන් තව දුරටත් යහපත් අතට හැරී රාත්තලක මිල රු. 1.97 ක් වුනු අතර, 1966 අනුරූප කාර්තුවට වඩා රාත්තලකට සත 15 කින් වැඩිවුණි.

විමර්ශනයට භාජනය වී ඇති වර්ෂයෙහි පළමුවැනි කාර්තු දෙක තුළ දී මැද රට තේ වල මිල, උඩ රට තේ මිලෙහි උපනතිය අනුගමනය කරමින් එම ප්‍රමාණයේ ම වගේ පිරිහීමක් දක්විය සාමාන්‍ය මිල, පළමු වැනි කාර්තුව තුළ දී රාත්තලකට සත 15 කින් ද තෙ වැනි කාර්තුව තුළ දී රාත්තලකට සත 6 කින් ද පිරිහුනි. එනමුත්, තුන් වැනි කාර්තුවේ දී මිල ගණන යහපත් අතට හැරුනෙන්, ඉකුත් වර්ෂයේ අනුරූප කාර්තුවේ දීට වඩා රාත්තලකට සත 4 කින් සාමාන්‍ය මිල වැඩි විය. හතර වැනි කාර්තුවේ දී මිල ගණන් තවත් යහපත් අතට හැරුනෙන්, රාත්තලක මිල 1.70 ක් විය. මේ වූකලී 1966 අනුරූප කාර්තුවේ දීට වඩා රාත්තලකට සත 24 කින් වූ වැඩි වීමකි.

පහත බිම් වල වගා කළ තේ වල මිල, 1967 පළමු වැනි සහ දෙ වැනි කාර්තු වල දී අයහපත් වූ අතර, එම කාර්තු වල දී රාත්තලක සාමාන්‍ය මිල පිළිවෙළින් රු. 1.10 ක් සහ රු. 1.04 ක් විය. මෙය 1966 අනුරූප කාර්තුවලට වඩා පිළිවෙලින් රාත්තලකට සත 52 ක සහ රාත්තලකට සත 36 ක පිරිහීමකි. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විශේෂයෙන් ම ඉරාකය ඇතුළු මැද පෙරදිග ගැනුම් කරුවන් විසින් මිලට ගෙන ඇති ප්‍රමාණය සීමිත වීම ය. පෙබරවාරි මැද දී කොළඹ වෙළෙඳ පොළින් ඉවත් වූ ඉරාක ආණ්ඩුවේ මිලට ගැනුමේ මණ්ඩලය නැවත ඇතුළු වූයේ මැයි මාසයේ දී ය. ඉරාකය තේ වෙළඳ පලින් ඉවත් වීමේ ප්‍රතිඵල වූයේ පහත රට තේ වලට සීමිත ඉල්ලුමක් ඇතිවීම සහ රාත්තලක වෙළඳ මිල ශත 90 දක්වා පහළ බැසීමය. තවද වෙළෙඳ පොළෙහි පහත් මිල පැවතීමේ ප්‍රතිඵලයක් වූයේ වෙළෙඳම සඳහා වූ තේ බොහෝ වශයෙන් ඉවත් කර ගැනීමය. තුන්වැනි කාර්තුවේදී මිල සතුටුදායක වුවද, .ඉකුත් වසරේ මෙම කාර්තුවේදීට වඩා රාත්තලකට ශත 7 කින් අඩු විය. කෙසේ වෙතත් අවසාන කාර්තුවේදී මිල තවදුරටත් සතුටුදායක විය. රාත්තලක සාමාන්‍ය මිල රු. 1·49, 1966 වර්ෂයේ හතරවැනි කාර්තුවට වඩා ශත 34 කින් හා 1967 වර්ෂයේ තුන්වැනි කාර්තුවට වඩා ශත 29 කින් වැඩිවීමක් පෙන්විය. මිලෙහි මෙම ඉහළ නැගීමට බොහෝ වශයෙන් හේතු වූයේ ලංකාවේ රුපියලෙහි අගය අඩු කිරීමත් සමඟ මැද පෙරදිග මිලදී ගන්නවුන්ගෙන් මෙම තේ වලට ඇති වූ ප්‍රාණවත් තරඟයයි.

තමන්ගේ අමු තේ වලට පහත් මිළක් ලබමින් සිටි කුඩා තේ වතු හිමියන්ට ක්ෂණික ආධාරයක් ලබා දෙනු වස් 1966 සැප්තැම්බර් 25 දින හඳුන්වා දෙනු ලැබූ අපනයන බදු ප්‍රතිදාන ක්‍රමය 1967 නොවැම්බර් 23 දින දක්වා ක්‍රියාත්මක විය. කොළඹ වෙන්දේසිවලදී රාත්තලක (දළ) මිළ රු. 1·50 ට අඩුවෙන් ලැබුවාවූ තේ සඳහා රු. 1·50 සහ වෙන්දේසියේදී ලත් මිළ අතර වෙනස ප්‍රතිදානයක් වශයෙන් මිළ ශත 35 ක උපරිමයකට යටත්ව ගෙවීමට මෙම ක්‍රමයෙන් ඉඩ සලසා තිබුණි. බාල වර්ගයේ තේ නිපදවීම අධෛර්‍ය කිරීමේ අදහසින් රාත්තලකට ශත 90 ට වඩා අඩුවෙන් ලැබූ තේ වලට ප්‍රතිදානය නොගෙවන ලදී. කුඩා තේ වතු හිමියන්ට ඔවුන්ගේ තේ වල වර්ගය උසස් කර ගැනීමට කාලය දීම් වස් ප්‍රතිදානය නොලබන පහළ මිළ පළමු සති හතරේ රාත්තලකට ශත 70 ද, ඊළඟ සති හතරේ රාත්තලකට ශත 80 ද වශයෙන් නියම කරන ලදී. මෙම කාලච්ඡේදය අවසානයේදී එය රාත්තලකට ශත 90 දක්වා වැඩි කරන ලදී. 1967 මාර්තු 13/14 දින වෙළෙඳමත් සමග පහත් මිළ මට්ටම රාත්තලකට රුපියල දක්වා වැඩි කළ යුතුව තිබුණද, රජය, මෙම තීරණය ක්‍රියාත්මක කිරිම සැප්තැම්බර් මාසය දක්වා කල් දමන ලදී. ශත 90–99 අතර පිරිස් ද ඇතුළු නිෂ්පාදකයන්ගේ තේ මිළ පහළ යාමෙන් දරන්නට සිදුවූ අපහසුකම් සලකා බැලීමෙනි.

පහත රට තේ වල මිළ වසරේ තුන්වැනි කාර්තුවලදී සතුටුදායක වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිදානය ගෙවීමේ පහළ මට්ටම සැප්තැම්බර් මස 4 දින සිට රාත්තලක රුපියල දක්වා ද, නැවත 1967 නොවැම්බර් 1 දින සිට රාත්තලකට 1·30 දක්වා ද නැංවිය.

සංඛ්‍යා සටහන II (ඵ) 5

**තේ සහනාධාර ක්‍රමය, කොළඹ වෙන්දේසිය**

| (1) | (2) | ප්‍රතිදානයට කැප වූ රාත්තල් ගණන සහ ගෙවන ලද රාත්තල් ගණන | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | උස් බිම් වගාව | | | මැදි බිම් වගාව | | | පහත් බිම් වගාව | | | එකතුව මුළු තේ | | |
| කාලච්ඡේදය | කොළඹ තේ වෙන්දේසියේ විකුණූ මුළු තේ ප්‍රමාණය | රාත්තල් ගණන රාත්තල් දශ ලක්ෂ | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | ගෙවන ලද සාමාන්‍ය ප්‍රතිදානය රා. 1 රු.ශ. ගණන | රාත්තල් ගණන රාත්තල් දශ ලක්ෂ | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | ගෙවන ලද සාමාන්‍ය ප්‍රතිදානය රා. 1 රු.ශ. ගණන | රාත්තල් ගණන රාත්තල් දශ ලක්ෂ | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | ගෙවන ලද සාමාන්‍ය ප්‍රතිදානය රා. 1 රු.ශ. ගණන | රාත්තල් ගණන රාත්තල් දශ ලක්ෂ | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | ගෙවන ලද සාමාන්‍ය ප්‍රතිදානය රා. 1 රු.ශ. ගණන |
| (අ) 1966 සැප්තැම්බර් 25 සිට 1966 දෙසැම්බර් 28 දක්වා | 71·2 | 1·5 | 0·4 | 0·24 | 4·2 | 1·1 | 0·27 | 15·0 | 4·5 | 0·30 | 20·7 | 5·9 | 0·29 |
| (ආ) 1967 ජනවාරි 7 සිට 1967 නොවැම්බර් 12 දක්වා | 335·4 | 9·9 | 2·6 | 0·26 | 47·9 | 13·0 | 0·27 | 85·5 | 25·3 | 0·29 | 143·3 | 40·8 | 0·28 |
| එකතුව (අ) + (ආ) .. | 406·6 | 11·4 | 3·0 | 0·26 | 52·1 | 14·1 | 0·27 | 100·5 | 29·8 | 0·30 | 164·0 | 46·7 | 0·29 |

මූලය: තේ පාලන දෙපාර්තමේන්තුව.

මෙම ප්‍රතිදානය ලැබීමට සුදුසු වීම සඳහා, කම්හාන්ත ශාලාවක් 1965 දී එහි මුළු නිෂ්පාදනයෙන්, අඩු වශයෙන් සියයට 25 ක් නිෂ්පාදනය කර තිබුනාවූ හෝ "මිළදී ගත් තේ" වලින් නිමවූ රාත්තල් 1,00,000 ක් සාදා තිබුනාවූ හෝ විය යුතු වූයේය.

1966 නොවැම්බර් 29 දින වෙන්දේසිය සමග, මෙම සහනාධාර ක්‍රමය සියලුම වතු ඇතුළත් වීමට පුළුල් කළද, සැලකිය යුතු ප්‍රමාණයක් "මිළදී ගත් කොළ" තේ සකස් කළ කම්හාන්ත ශාලා නවයක් හැරෙන්නට, සියළුම උඩරට තේ වලට කලින් ගෙවූ

අපනයන බදු ප්‍රතිදානය කිරීමේ පහසුකම 1967 අප්‍රියෙල් 11 දින සිට රජය ඉවත්කර ගන්නා ලදී. 1967 නොවැම්බර් 22 දින ලංකා රුපියල අව ප්‍රමාණ කිරීමත් සමග අපනයන බදු ප්‍රතිදානය මුළුමනින් ම ඉවත්කර ගන්නා ලදී.

II (එ) 5 සටහනින් ප්‍රතිදානය සලස්වන ලද ප්‍රමාණයන්, ප්‍රතිදානය වශයෙන් ගෙවන ලද මුළු මුදල සහ රාත්තලකට ගෙවන ලද සාමාන්‍ය ප්‍රතිදානය පිළිබඳ විස්තර දක්වෙයි. තොරතුරු අයත්වන කාලඡෙදය (1) වැනි තීරුවෙන් දක්වේ.

1967 ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා වූ මාස 11 කාලඡෙදයේදී කොළඹ වෙන්දේසිවලදී විකුණන ලද මුළු තේ ප්‍රමාණය වූ රාත්තල් දශලක්ෂ 335·4 න් රාත්තල් දශලක්ෂ 143·3 කට නොඅඩු ප්‍රමාණයක් හෙවත් සියයට 42·7 ක් ප්‍රතිදානය සඳහා සුදුසු විය. මෙම ක්‍රමය යටතේ වූ ප්‍රතිදානයන් වෙනුවෙන් 1967 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 40·8 ක වියදමක් විය; ඉන් රුපියල් දශලක්ෂ 25·3 ක් හෙවත් සියයට 62·0 ක් පහත රට තේ සඳහා ද, රුපියල් දශ ලක්ෂ 13·0 ක් හෙවත් සියයට 31·9 ක් මැද රට තේ සඳහා ද විය. තේ සඳහා ගෙවූ සාමාන්‍ය ප්‍රතිදානය රාත්තලකට ශත 28 ක් විය. 1967 වර්ෂයේදී පහත රට තේ සඳහා රාත්තලකට ශත 29 ක් ද, මැද රට හා උඩ රට තේ සඳහා පිළිවෙලින් රාත්තලකට ශත 27 ක් සහ ශත 26 ක් ද ප්‍රතිදානය වශයෙන් ලැබුවේය.

මෙම ක්‍රමය ක්‍රියාත්මක වෙමින් පැවති 1966 වර්ෂයේ අවසාන මාස තුන තුළදී ඒ සඳහා වූ මුළු වියදම රුපියල් දශලක්ෂ 5·9 ක් වූයේය. ඉන් රුපියල් දශලක්ෂ 4·5 ක් හෙවත් සියයට 76·0 ක් පහත් බිම් වගාවේ තේ සඳහා විය. මෙසේ මෙම ක්‍රමය ක්‍රියාත්මක වෙමින් පැවති මාස 11 ක කාලඡෙදයේදී රජයට දරන්නට වූ මුළු වියදම රුපියල් දශලක්ෂ 46·7 ක් විය. කොළඹ වෙන්දේසිවලදී විකුණන ලද තේ වලින් රාත්තල් දශලක්ෂ 164·0 ක් ප්‍රතිදානය සඳහා සුදුසු වූ අතර මුළු කාලඡෙදය තුළදී ගෙවන ලද සාමාන්‍ය ප්‍රතිදානය රාත්තලකට ශත 29 ක් විය.

### ලන්ඩන් වෙන්දේසි[1]

ලන්ඩන් වෙළෙඳ පළේ[1] වාර්ෂික සාමාන්‍ය මිළ ගණන් පරීක්ෂා කිරීමේදී පහළට යමින් තිබූ වෙන්දේසි මිල 1967 දී නැවතුනු බව පෙනේ. මෙම වෙළෙඳ පොළේදී විකුණනු ලැබූ සියළුම වර්ගයේ තේ රාත්තලක සාමාන්‍ය මිල සිලිං 4 පැන්ස 1·81 ක් වූයෙන් පැන්ස 0·95 ක වැඩිවීමක් පෙන්වීය. මිලෙහි මෙම වැඩිවීම, ඉකුත් වසරේ රාත්තලකට පැන්ස 1.31 ක පහළ වැටීමත් 1965 වර්ෂයේ රාත්තලකට පැන්ස 1·28 ක පහළ වැටීමටත් ප්‍රතිවිරුද්ධය. වසරේ ප්‍රථම අර්ධය තුළදී තේ වල මිලෙහි සැළකිය යුතු මිල උච්ඡාවචනයන් ඇති වූ අතර 1967 ප්‍රථම අර්ධය තුළදී මෙම වෙළෙඳ පොළේ විකුණූ සියළුම වර්ගයේ තේ වල මිල රාත්තලක් සිලිම් 3 පැන්ස 11·13 ක් වූයේය; මෙය ඉකුත් වසරේ මෙම කාලඡෙදයේදීට වඩා රාත්තලකට පැන්ස 1·16 කින් පහළ යාමයි.

විශේෂයෙන්ම මෙම කාලඡෙදය තුළ ඇති වූ මිල පහළ බැසීමට බොහෝ වශයෙන් හේතු වූයේ, වෙන්දේසිවලට ඉදිරිපත් කරන ලද තේවල වර්ගය බාලවීමය. මෙම බලපෑම එකී වෙන්දේසිවලදී විකුණන ලද තේ වලින් සියයට වැඩි කොටසක් අයත් වූ උතුරු ඉන්දියානු තේ සම්බන්ධයෙන් විය. 1967 ජූනි – ජූලි මාසවලදී වෙළෙඳ පොළේ තේ මිල සුපුරුදු ලෙස පහත් මට්ටමට එළඹියත් අගෝස්තු මාසය තුළදී ද පහළ මට්ටමේම පැවතින. දෙවෙනි තත්ත්වයට හේතු වශයෙන් පෙනෙනුයේ, නව වාරයේ තේ වෙළෙඳ පොළට පැමිණීම ප්‍රමාදවීමය. මෙයට හේතුව වූයේ ජූනි මාසයේදී සූවස් ඇළ වැසීම නිසා ශුභ ප්‍රාථිනා තුඩුව ඔස්සේ දීර්ඝ මාර්ගයකින් යාත්‍රා කිරීමට සිදුවීමය. සැප්තැම්බර් මාසයේදී නව වාරයේ තේ ලඟාවීමත් සමග වෙළඳ

1. ලන්ඩන් තේ බ්‍රෝකර්වරුන්ගේ සංගමය, තේ වෙළඳ පොලේ සතිපතා වාර්තා, ඉන්වෙස්ටර් ගාර්ඩියන්ස් සහ පොදු ලේජරයන්.

මිල තිබුණු ලෙස ඉහළ ගියේය. මෙම ඉහළ යෑමේ ප්‍රවණතාවය අනතුරු තුන්මාසයක් පැවති අතර ලංකාවේ ඉස්තරම් වගීයේ තේ ද වෙන්දේසියට තබන ලදී. එක්සත් රාජධානියේ (ලන්ඩන් සහ ලිවර්පූල්) වරායවල සැප්තැම්බර් මාසයේ ආරම්භ වී ඔක්තෝබරයේ පැවති අනියම් වැඩ වර්ජන, තේ මිල ඉහළ මට්ටමේ පවත්වා ගැනීමට උපකාරී විය. වැඩ වර්ජන පැවති වරායවලදී බඩුබෑමට නියමිත නැව්, මහාද්වීපයේ වෙත හරවා යැවීමට නැව් සමාගම්වලට වැඩ වර්ජනය බලකරන ලදින්, එය ලන්ඩන් වෙළඳ පල සඳහා ඉදිරිපත් කළ තේ ප්‍රමාණයන් අඩුවීමට හේතු විය. ඔක්තෝබර් මාසයේ පසු භාගයේදී වැඩ වර්ජනය අවසන් වුවද, ගුහ ප්‍රාර්ථනා තුඩුව හරහා ඒමට වූ දීර්ඝ මාගීය නිසා තේ තොග ප්‍රමාද වී ලඟාවීමත්, බර වෙනුවට ගබඩා බර යොදා, වෙළඳ වට්ටෝරු මුද්‍රණය කිරීමේ ක්‍රමය වෙනස් කිරීමත් නිසා වෙළඳ පොළ කරා පැමිණි ප්‍රමාණයන් අඩු විය. මෙම සියළුම කරුණුවල ප්‍රතිඵලය වූයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස තුළදී වෙළඳ මිල ඉහළ මට්ටමක පැවතීමය.

වසර තුළදී ලන්ඩන් වෙන්දේසිවලදී විකුණනු ලැබූ සියළුම වගීයේ ලංකා තේ රාත්තලක මිල සිලිම් 4 පැන්ස 4·33 ක් වූයේ; ඉකුත් වසරට වඩා රාත්තලකට පැන්ස 1·45 කින් වැඩි විය. කෙසේ වෙතත් 1966 සහ 1965 වර්ෂවලදී ලන්ඩන් වෙළඳ පොළේ ලංකා තේ මිල පිළිවෙලින් රාත්තලකට පැන්ස 0·27 කින් සහ රාත්තලකට පැන්ස 2·70 කින් පහළ වැටී තිබුණි 1967 දී ලංකා තේ රාත්තලක සාමාන්‍ය මිල පැන්ස 1·45 කින් වැඩිවීම, උතුරු ඉන්දියානු හා දකුණු ඉන්දියානු තේවල සාමාන්‍ය මිල ඉහළ යාමත් සමග සිදුවිය. දකුණු ඉන්දියානු තේ වල සාමාන්‍ය මිල රාත්තලකට සිලිම් 3 පැන්ස 6·48 ක් වූයේ, 1966 වර්ෂයට වඩා රාත්තලකට පැන්ස 1·44 කින් වැඩි වූ අතර, උතුරු ඉන්දියානු තේ සඳහා වූ සාමාන්‍ය මිල රාත්තලකට සිලිම් 4 පැන්ස 5·71 ක් වූයේ 1966 වර්ෂයට වඩා රාත්තලකට පැන්ස 1·57 කින් වැඩිවිය. මලාවි, ආර්ජන්ටයින් සහ වියට්නාමය හැර, අනෙකුත් සියළුම තේ නිෂ්පාදක රාජ්‍යයන්ගේ තේ වල මිල වැඩිවිය. ඉහත සඳහන් රටවල් තුනේ තේ සඳහා පහත් මිලක් ලැබුනේ ඒවා බාල වගීයේ තේ වූ නිසා විය හැකිය. මෙම මධ්‍යස්ථානයේ විශේෂයෙන් වර්ෂයේ අවසාන මාසවලදී බාල වගීයේ තේ අඩු ප්‍රමාණයක් පැවතීම, අනෙකුත් නිෂ්පාදක රටවල එනම් අප්‍රිකානු රාජ්‍යවල, මුරිසි හා මලයා තේවලට වඩා හොඳ තත්ත්වයක් ලබා දුනි.

1967 වර්ෂයේදී ලන්ඩන් වෙන්දේසිවලදී විකුණනු ලැබූ මුළු තේ ප්‍රමාණය රාත්තල් දශලක්ෂ 284 ක්[1] වූයේය. මෙය 1966 වර්ෂයේ විකුණූ ප්‍රමාණයට වඩා රාත්තල් දශලක්ෂ 53 කින් හෙවත් සියයට 16 කින් පහළ යෑමක් පෙන්විය. පරිමාවේ මෙම පහළ යෑම මෙම වෙළඳ පලට තේ එවනු ලබන සියළුම ප්‍රධාන නිෂ්පාදන රටවල් අතර බෙදී ගියේය. වසරේදී මෙම වෙන්දේසි වලදී විකුණනු ලැබූ උතුරු ඉන්දියානු හා දකුණු ඉන්දියානු තේ ප්‍රමාණය පිළිවෙළින් රාත්තල් දශලක්ෂ 113 ක් සහ රාත්තල් දශලක්ෂ 12 ක් වූයේ, ඉකුත් වසරට වඩා පිළිවෙලින් රාත්තල් දශලක්ෂ 28 කින් සහ රාත්තල් දශලක්ෂ 8 කින් පහළ ගියේය. මේ අතර ලංකාවේ සහ අප්‍රිකානු රාජ්‍යවල ප්‍රමාණය පිළිවෙලින් රාත්තල් දශලක්ෂ 96 ක් සහ රාත්තල් දශලක්ෂ 56 ක් වූයේ, ඉකුත් වසරේ මට්ටමට වඩා පිළිවෙලින් රාත්තල් දශලක්ෂ 11 කින් හා රාත්තල් දශලක්ෂ 2 කින් අඩුවිය.

1967 ප්‍රථම මාස හතර තුළදී එක්සත් රාජධානියේ පැවති තේ තොග 1966 එම මාසවලදීට වඩා අඩුවූ නමුදු, 1965 අනුරූප මාසවලදීට වඩා වැඩිවිය. කෙසේ වෙතත්, 1967 මැයි සහ ජූනි මාසවල තේ 1965 සහ 1966 වර්ෂවල

---

1. ලන්ඩන් තේ බ්‍රෝකර් වරුන්ගේ සංගමයේ 1967 දෙසැම්බර් 22 දින, අංක 796 තේ වෙළඳ වාර්තාව.

එකී මාසවලදීට වඩා වැඩි මට්ටමක පැවතිණ. වසරේ දෙවන භාගය මුළුල්ලේ එක්සත් රාජධානියේ පැවති තේ තොග, 1966 සහ 1965 අනුරූප කාලඡේදයේ දීට වඩා සැලකියයුතු ප්‍රමාණයකින් අඩු විය. තේ තොග මෙසේ පහළ යෑමට හේතු වූයේ, ලඟාවීම නිසා යාත්‍රාවේමින් තිබූ ප්‍රමාණය විශාල වීමය. මෙසේ වසර අගදී වූ තේ තොග ප්‍රමාණය, රාත්තල් දශ ලක්ෂ 135[1]ක් හෙවත් 1966 අවසානයට වඩා රාත්තල් දශ ලක්ෂ 8 ක් අඩු විය.

ලන්ඩන් වෙළෙඳ පොළේ සාමාන්‍ය මිල වැඩිවීමට තවදුරටත් සාධකයක් වූයේ ඉකුත් වසරේ ගලා ආ තේ වලට වඩා මෙම සෘතුවේදී දෙවනුව ගලා ආ තේ වල වගීයේ ද්‍රව්‍යාත්මක වැඩි දියුණුවයි. වගීයේ මෙම දියුණුවට බොහෝ දුරට හේතු වූයේ වගා කරන තත්ත්වයද, විශේෂයෙන් දේශගුණයද සතුටුදායක වීමය.

ලෝක නිෂ්පාදනය පිළිබඳව ලබා ගත හැකි සංඛ්‍යා අනුව, 1967 තේ නිමැවුම රාත්තල් දශ ලක්ෂ 1547 ක් වූයේය.[2] මෙම 1966 වර්ෂයේදී පැතිය, වවඩා වැඩිවූයේ රාත්තල් දශ ලක්ෂ 5 කින් පමණක් බව දක්වයි. 1966 දී රාත්තල් දශ ලක්ෂ 44 ක වැඩිවීම හා මෙය සැසඳේ. උතුරු ඉන්දියාව සහ පකිස්ථානය නිෂ්පාදනයේ වැඩි-වීම දක්වූ අතර, අනෙකුත් සියළුම ප්‍රධාන නිෂ්පාදක රටවල්, නිෂ්පාදනයේ අඩුවීමක් දක්විය. දකුණු ඉන්දියාවේ, ලංකාවේ සහ නැගෙනහිර අප්‍රිකාවේ තේ නිෂ්පාදනය අඩුවීමට, වගකිව යුතු ප්‍රධාන සාධකය වූයේ අහිතකර කාල ගුණයයි. ඉන්දියාව මුළුමනින් ගත් විට ඇගේ නිෂ්පාදනය රාත්තල් දශ ලක්ෂ 8 කින් වැඩි කළ අතර පකිස්ථානය රාත්තල් දශ ලක්ෂ 3 කින් නිෂ්පාදන වැඩිවීමක් පෙන්නුම් කළාය.

රබර්.

1966 රාත්තල් දශ ලක්ෂ 28 කින් හෙවත් සියයට 11 කින් ඉහළ ගිය රබර් නිෂ්පාදනය 1967 දී තව දුරටත් රාත්තල් දශ ලක්ෂ 27 හෙවත් සියයට 9 කින් වැඩිවීම නිසා රාත්තල් දශ ලක්ෂ 316 ක් වූයේය. ෂීට් රබර් නිෂ්පාදනය රාත්තල් දශ ලක්ෂ 16·8 කින් ඉහළ ගිය අතර ක්‍රෙප් සහ ලේටෙක්ස් රබර් නිෂ්පාදනය පිළිවෙළින් රාත්තල් දශ ලක්ෂ 9·9 කින් සහ රාත්තල් දශ ලක්ෂ 0·3 කින් වැඩිවිය. නිමැවුමේ මෙම දියුණුවට හේතු වූයේ, අලුතෙන් නිෂ්පාදනයට පැමිණෙන නව වගාවන්ගෙන් උසස් පළදාවන් ලැබීමය. 1966 වර්ෂයේදී රාත්තල් දශ ලක්ෂ 4·9 ක් වූ දේශීය රබර් පරිභෝජනය, 1967 දී රාත්තල් දශ ලක්ෂ 1·0 කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 5·9 දක්වා ඉහළ ගියේය. රබර් අපනයනයේ පරිමාවෙහි 1966 දී රාත්තල් දශ ලක්ෂ 31 ක හෙවත් සියයට 12 ක තියුණු වැඩිවීමක් සිදුවිය. 1967 දී රාත්තල් දශ ලක්ෂ 291 දක්වා රාත්තල් දශ ලක්ෂ 7 ක හෙවත් සියයට 2 ක අඩුවීමක් සිදු විය.[3] 1966 වර්ෂය සමග සැසඳීමේදී අපනයනය කළ රාත්තල් දශ ලක්ෂ 163·3 ක් වූ ෂීට් රබර් ප්‍රමාණය, රාත්තල් දශ ලක්ෂ 16·8 කින් (හෙවත් සියයට 9·3 කින්) පහළ ගිය අතර රාත්තල් දශ ලක්ෂ 127·4 ක් වූ ක්‍රෙප් රබර් (සෑම වර්ගයේම) අපනයනය රාත්තල් දශ ලක්ෂ 9·2 කින් (හෙවත් සියයට 8·1 කින්) ඉහළ ගොස් ඇත.

ලෝක වෙළෙඳ මධ්‍යස්ථානවල මිල සංචලන රටාව අනුගමනය කරමින් 1967 දී කොළඹ වෙළෙඳ පොළේ ආර්. එස්. එස්. නො: 1 රබර් රාත්තලක මිල ද පහළ යෑම් උපනතියකට පත් විය. කොළඹ වෙළෙඳ පොළේ ආර්. එස්. එස්. නො:

---

1 ලන්ඩන් තේ බ්‍රෝකර් වරුන්ගේ සංගමයේ 1968 ජනවාරි 5 දින අංක 797 තේ වෙළෙඳ වාර්තාව.

2 ජෝන්, කීල් තොමසන්, වයිට් සීමිත සමාගම, සතිපතා තේ වෙළෙඳ වාර්තාව, 1968 මාර්තු 20

3. මුළු රබර් අපනයනය වන රාත්තල් දශ ලක්ෂ 291 අපනයනය කළේ යයි තබා ඇති ගිණුම අනුවය. රේගු වාර්තාව, පැහැදිලි කිරීමේ අධෝලිපියක් මගින්, 1967 – ජනවාරියේ සිට දෙසැම්බර්ය දක්වා කාල-යේදී නැව් ගත කළ නියම ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 298·9 බව සඳහන් කරයි. ලංකා රේගු වාර්තා 1967 දෙසැම්බර්-පිටු 695

1 ෂීට් රබර් මිල 1966 දී දිගටම පෙනුන මිල පිරිහීම 1967 සැප්තැම්බරය තෙක්ම පැවති අතර, වෙළෙඳ පොලේ සාමාන්‍ය මිල ශත 71 ක් තරම් පහළට වැටුනේය. ඔක්තෝබර් සහ නොවැම්බර් මාස දෙක තුළදී සාමාන්‍ය වෙළෙඳ මිලෙහි මඳවූ දියුණුවක් දක්විය. ලංකා රුපියලේ මිල අවප්‍රමාණ කිරීමෙන් පසු වෙළෙඳ පොලෙහි මිල ඉහළ ගියේය. ෂීට් රබර්ආර්. එස්. එස්. නො: 1 හි සාමාන්‍ය මිල 1967 දෙසැම්බරයේදී කලින් මාසවලට වඩා රාත්තලකට ශත 11 කින් (හෙවත් සියයට 15 කින්) සහ 1966 දෙසැම්බරයේදී සාමාන්‍ය වෙළෙඳ මිලට වඩා රාත්තලකට ශත 2 කින් වැඩි විය. 1966 වාර්ෂික සාමාන්‍ය මිල සමග සසඳන විට 1967 දී ආර්. එස්. එස්. නො: 1 හි වාර්ෂික සාමාන්‍ය මිල රාත්තලකට ශත 10 කින් හෙවත් සියයට 11 කින් පහළ ගියේ ය.

ලේටෙක්ස් ක්‍රෙප් නො: IX යෙහි සාමාන්‍ය මිල පහළ යාම 1966 අගෝස්තු මාසයේ දී ඇරඹී 1967 දී ද පැවතුනි. එවිට රාත්තලකට ශත 82 වනතුරු මිල පහළ ගියේය. නොවැම්බර් මාසයේ මාසික සාමාන්‍ය මිලෙහි මඳවූ දියුණුවක් පෙන්නුම් කළේය. රුපියල අවප්‍රමාණ කිරීමෙන් පසු ඉකුත් මාසයේ මිලට වඩා රාත්තල ශත 7 කින් (හෙවත් සියයට 8 කින්) පැහැදිලි අන්දමේ ඉහළ යාමක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත් මෙය රාත්තල ශත 7 කින් පහළ ගිය බව 1966 දෙසම්බර් මාසය සමග සැසැඳීමේදී පෙනී යයි.

## සංඛ්‍යා සටහන II (එ) 6

## රබර් නිෂ්පාදනය, අපනයනය සහ මිල

| වර්ෂය | නිෂ්පාදන රාත්තල් දශ ලක්ෂ | අපනයන රාත්තල් දශ ලක්ෂ | රාත්තලක නැ.වි.ස. මිල රු. ශ. | ආර්. එස්. එස්. නො. 1 ෂීට් රබර් රාත්තලක් කොළඹ වෙළඳ පොළේ මිල රු. ශ. |
|---|---|---|---|---|
| 1960 | 218 | 235 | 1·61 | 1·24 |
| 1961 | 215 | 197 | 1·32 | 1·01 |
| 1962 | 229 | 224 | 1·29 | 0·98 |
| 1963 | 231 | 209 | 1·23 | 0·93 |
| 1964 | 246 | 253 | 1·15 | 0·90 |
| 1965 | 261 | 267 | 1·14 | 0·91 |
| 1966 | 289 | 298 | 1·13 | 0·89 |
| 1967 | 316 | 291 | 0·97 | 0·79 |

මූලය: රබර් පාලක තැනගේ පාලන වාර්තා
ලංකා රේගු වාර්තා,
කොළඹ රබර් වෙළෙඳුන්ගේ සංගමය

1967 දී ජාත්‍යන්තර වෙළෙඳ පොලේ ස්වාභාවික රබර් මිල පහළ යෑමේ උපනතියක් පෙන්විය. සවාභාවික රබර් මිල පහළ යෑමට හේතු අතර, අඩු මිලකට කෘත්‍රිම රබර් වැඩිපුර ලබා ගත හැකිවීම, ඇමරිකා එක්සත් ජනපදයේ තොග රැස්කිරීමේ ප්‍රතිපත්තියේ යම් යම් වෙනස්කම් නිතර ඇතිවීම, ඇමරිකා එක්සත් ජනපදයේ ටයර් සහ මෝටර් රථ නිෂ්පාදනයේ කම්කරු නොසන්සුන්තා ඇතිවීම, යුරෝපීය නිෂ්පාදකයන් විසින් මිළදී ගැනීම අඩු කිරීම සහ ඉන්දුනීසියා-වෙන් වැඩි සැපයුමක් ඇතිවීමත් පෙන්විය හැක. 1967 නොවැම්බර් සහ ජනවාරි අතර (ලබා ගත හැකි සමීපම තොරතුරය.)[1] ලෝක කෘත්‍රිම රබර් නිෂ්පාදනය ටොන් 3,092,500 ක ප්‍රමාණයක් විය. එය 1966 අනුරූප කාලඡේදයේදී එය ටොන් 3047,500 විය.

1967 එකී කාලඡේදයේදී ටොන් 3,037,600 ක ප්‍රමාණයක් පාරිභෝජනය සඳහා ගනු ලැබියයි ගණන් බලා ඇත. 1966 එම කාලඡේදයේදී එකී ප්‍රමාණය ටොන් 2,970,000 ක් විය. 1967 ජනවාරි සිට නොවැම්බර් කාලය තුළදී ඇමෙරිකා

1. පබ්ලික් ලෙජරය, 1968 මාර්තු 2, පිටුව 3.

එක්සත් ජනපදයේ මුදුහැරීම් තොග ඇතුළු ස්වාභාවික රබර්වල ලෝක සැපැයුම ටොන් 2,315, 000 ක් විය. මෙය 1966 එකී කාලච්ඡේදයේදී ටොන් 23,25,000 කි. 1966 ජනවාරියේ සිට නොවැම්බරය දක්වා කාලච්ඡේදය තුලදී සවාභාවික රබර් පරිභෝජනය 23,222,500 ක් වූ අතර, 1967 එම කාලය තුල පරිභෝජනය ටොන් 22,57.500 ක් වූයෙන් 1967 තුලදී පාරිභෝජනය ටොන් 65,000 ක නැනහොත් සියයට 2·8 ක පහළ වැටීමක් දක්විණි.

මැයි, ජූනි සහ ජූලි යන මාස වල මැද පෙරදිග යුද්ධය නිසා සුළු ඉහළ යාමක් ඇති වුවත් 1967 ආරම්භයේ සිට ලෝක වෙළෙඳ මධ්‍යස්ථානවල ස්වභාවික රබර් මිළ ක්‍රමයෙන් පහළ වැටුණි. 1967 සැප්තැම්බර් මාසයේදී වෙළෙඳ පොළේ පැවති ආර්. ඒස්. එස්. නොః 1 සඳහා ලන්ඩන් වෙළෙඳ පොළේදී රාත්තලක මාසික සාමාන්‍ය මිළ වූ සිලිම් 1 පැන්ස 3 17/32 ක සටහන් වී ඇති අඩුම මිළයි. නොවැම්බර් මාසයේ ආර්. එස්. එස්. නොః 1 රබර් සඳහා සිංගප්පූරු වෙළෙඳ පොළේදී සාමාන්‍ය නෑ. වි. ස මිළ වූ සිංගප්පූරු ශත 49·20 මෙම කාල සීමාව තුළ වාර්තා ගතවී ඇති අඩු මිළ ප්‍රමාණය විය. වෙළෙඳ පොළේ පැවති ආර්. එස්. එස් නොః 1 ෂීට් රබර් සඳහා ලන්ඩන් වෙළෙඳ පොළේදී වාර්ෂික මිළ රාත්තලකට සිලිම් 2 17/32 කින් අඩුවී රාත්තල සිලිං 1 පැන්ස 5 5/16 කට පහළ ගියේය. මෙම වර්ගයේ රබර් සඳහා සිංගප්පූරු වෙළෙඳ පොළේ පැවති වාර්ෂික සාමාන්‍ය නෑ වි. ස මිළ වන සිංගප්පූරු ශත 54·08 1966 දී වාර්ෂික මිළට වඩා සිංගප්පූරු ශත 11·28 කින් අඩුය.[1]

**පොල් නිෂ්පාදිත**

1966 දී ලෝක වෙළෙඳ පොළෙහි, ආහාරයට ගන්නා තෙල් වර්ගවල මිළ පහළ යෑමේ උපනතියක් පැවතියද, 1967 දී එය මඳ දියුණුවකට පත් විය. නිෂ්පාදනය අඩු වීමෙන් පිලිපයිනයේ අපනයන පහළ යාමත්, දේශපාලන නොසන්සුන්කාරී තත්ත්වය නිසා නයිජීරියාවෙන් පාම් තෙල් සහ පාම් මද නැව් ගත කිරීම අඩු වීමත්, සූවස් ඇළ වැසීම නිසා බඩු තොග ගෙන යාමට ඇතිවූ බාධාවනුත් මිළ වැඩිවීමට ඇතුලත් හේතු අතර විය. ලෝක වෙළෙඳ පොළෙහි කොප්පරා සහ පොල්තෙල්වල මිලෙහි දියුණුවක් 1967 ප්‍රථම භාගයේදී පැහැදිළිව නොපෙනුන අතර 1966 දී ඒවායේ මිළ පහළ මට්ටමක පැවතියේය. සූවස් ඇළ වැසීමෙන් පසු, 1967 දෙවැනි අර්ධයේදී පොල් නිෂ්පාදනවල මිලෙහි සැලකිය යුතු දියුණුවක් පෙන්වීය. එවිට 1966 අනුරූප කාලයේදීපැවතියා ට වඩා මිළ සෑහෙන තරමින් ඉහළ ගියේය.

කොළඹ වෙළෙඳ පොළේ දී ද පොල් නිෂ්පාදිතයන්හි මිල 1966 අවසාන කාර්තුවේ තිබුණාට වඩා මඳක් සතුටුදායක වීමක් 1967 මුල් කාර්තුව තුලදී පෙන්විය. 2 වෙනි හා 3 වෙනි කාර්තු අතර ඉල්ලුම පහළ මට්ටමක පැවතියේ මැද පෙරදිග තත්ත්වය නිසා නැව් ගමනා ගමනයේ අවිනිශ්චිත තත්ත්වයක් ඇති වීම හේතු කොට ගෙනය. මේ නිසා කොළඹ වෙළෙඳ පොළෙහි මිළ මඳක් පහළ වැටුණි. 1967 සතර වෙනි කාර්තුවේ දී මිලෙහි විශාල දියුණුවක් පෙනුනේ, ලෝක ඉල්ලුමේ වැඩිවීම නිසාය. නොම්මර 1 වතු කොප්පරා සඳහා කොළඹ වෙළෙඳ පොළේ සාමාන්‍ය මිල වන පාරමකට රුපියල් 198·07, සියයට එකකින් හෙවත් රුපියල් 1·91 කින් වැඩි වූ අතර, රුපියල් 0·49 ක්වූ කපාපු පොල්, 1966 සාමාන්‍ය මිලට වඩා සියයට 4·3 කින් හෙවත් ශත 2 කින් ඉහළ ගියේය. පොල් තෙල්වල සාමාන්‍ය වාර්ෂික මිල ටොන් එකක් රුපියල් 1152·75 ක් වූයේය. මෙය 1966 වාර්ෂික සාමාන්‍ය මිලට වඩා සියයට 0·6 හෙවත් රුපියල් 6·52 කින් පහළ යාමකි.

1967 ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනේ අපනයන පරිමාව 1966 මට්ටමට වඩා සියයට 8 කින් පහළ වැටුණි. අපනයන පරිමෘවේ පහළ වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොල් නිෂ්පාදනය අඩුවීමය. 1967 දී පොල් නිෂ්පාදනයට ඉඩෝරය බල

1 පබ්ලික් ලෙජර් මාර්තු 2 වන 1968 පිටු 3.

පැවේය. 1966 වර්ෂය හා සසඳන විට 1967 දී ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනේ අපනයන පරිමාව විවිධ ප්‍රමාණ වලින් පහළ ගියේය. කොප්පරා අපනයන පරිමාව හොණ්ඩර 316 දහස, හොණ්ඩර 101 දහසකින් හෙවත් සියයට 24·2 කින් ද, පොල් තෙල් හොණ්ඩර 1334 දහස, හොණ්ඩර 123 දහසකින් හෙවත් සියයට 8·4 කින් ද, පහළ වැටුණි. 1966 සමග සසඳන විට කපාපු පොල් අපනයනය වන හොණ්ඩර 926 දහස, සියයට 0·4 කින් හෙවත් හොණ්ඩර හාර දහසකින් පහළ වැටුණි.

ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනේ වාර්ෂික සාමාන්‍ය නැ. වි. ස. මිල 1966 වර්ෂය හා සසඳන විට 1967 වර්ෂයේදී පහළ වැටීමක් පෙන්විය. කොප්පරා සහ කපාපු පොල් වල වාර්ෂික සාමාන්‍ය නැ. වි. ස. මිල පිළිවෙලින් සියයට 0·5 සහ සියයට 1·7 කින් පමණක් පහළ වැටිණි. පොල් තෙල් වල වාර්ෂික සාමාන්‍ය මිල 1966 පැවති මට්ටමට වඩා සියයට 11·8 කින් පහළ වැටිණ.

II (එ) 7 සංඛ්‍යා සටහන ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනේ අපනයන සහ මිල දක්වේ.

### සංඛ්‍යා සටහන II (එ) 7

### ප්‍රධාන පොල් නිෂ්පාදිත - අපනයන, පරිමාව සහ මිල

| වර්ෂය | ප්‍රමාණය | | | | නැ. වි. ස. මිල | | |
|---|---|---|---|---|---|---|---|
| | පොල් තෙල් හොණ්ඩර දහස් ගණනින් | කොප්පරා හොණ්ඩර දහස් ගණනින් | කපාපු පොල් හොණ්ඩර දහස් ගණනින් | එකතුව (නිෂ්පාදනය සඳහා වැයවූ පොල් ගෙඩි ප්‍රමාණය) ගෙඩි දශ ලක්ෂ | පොල් තෙල් ටොන් එකක මිල රු. ශත | කොප්පරා පාරමක මිල රු. ශත | කපාපු පොල් රාත්තලක මිල රු. ශත |
| 1960 | 1,110 | 583 | 1,099 | 976 | 1,436·60 | 276·15 | 0·58 |
| 1961 | 1,837 | 1,100 | 967 | 1,335 | 1,163·20 | 217·35 | 0·44 |
| 1962 | 2,043 | 1,448 | 981 | 1,530 | 1,101·60 | 203·70 | 0·51 |
| 1963 | 1,621 | 862 | 967 | 1,208 | 1,220·80 | 227·75 | 0·55 |
| 1964 | 2,351 | 1,162 | 1,080 | 1,618 | 1,308·40 | 237·20 | 0·53 |
| 1965 | 1,738 | 819 | 1,041 | 1,270 | 1,661·80 | 296·30 | 0·71 |
| 1966 | 1,457 | 417 | 930 | 1,017 | 1,489·00 | 294·60 | 0·60 |
| 1967 | 1,334 | 316 | 926 | 940 | 1,314·00 | 293·07 | 0·59 |

මූලය: ලංකා රේගු වාර්තා

පාරමක් = හොණ්ඩර 5 යි.

**ආනයන**

මීට ඉහත දී පෙන්වා දුන් අයුරු (20 වැනි පිට බලන්න), 1967 දී ආනයනයන්හි වූ, රුපියල් දශ ලක්ෂ 290 ක විශාල සංකෝචනය සැලකිල්ලෙන් විමසිය යුතුව ඇත. මුළු ආනයන පිළිබඳ සංඛ්‍යාව, මේ වර්ෂය තුළදී නියම වශයෙන් සිදු වූ ආනයනයන් ගේ වටිනාකම අඩු කර දක්වා ඇති අතර, ඉකුත් වර්ෂයේ ආනයනයන්ගේ වටිනාකම වැඩියෙන් දක්වා ඇත. උදාහරණයක් වශයෙන් පාරිභෝගික භාණ්ඩ අතර "ආහාර පාන" උප කොටසෙහි ඇති සහල් පිටි හා සීනි ආනයන දක්වෙන රේගු සංඛ්‍යාව වූ, රුපියල් දශ ලක්ෂ 514, ආහාර කොමසාරිස් වරයා නියම වශයෙන් ලද ආනයනයන්ගේ වටිනාකමට වඩා රුපියල් දශ ලක්ෂ 35 කින් අඩුය. ඉකුත් වර්ෂයේ දී රේගු තොරතුරු මගින් මෙම ද්‍රව්‍යයන්ගේ වටිනාකම රුපියල් දශ ලක්ෂ 121 ක් වැඩියෙන්, අගය කරන ලදී. මෙම වෙනස්කම් ගැලපීමෙන් පසුව, ඇස්තමේන්තු කරන ලද ආනයනයන්ගේ වටිනාකම රුපියල් දශ ලක්ෂ 134 කින් පහළ බැස තිබුණි.

ආහාර කොමසාරිස් වරයාගේ සහල්, පිටි සහ සීනි නියම ආනයනයන් අනුව රේගු තොරතුරු ගැලපීමෙන් පසු, නියම තත්ත්වය, II (එ) 8 වැනි සංඛ්‍යා සටහනින් පෙන්වා දී ඇත.

## සංඛ්‍යා සටහන II (එ) 8

### ආහාර කොමසාරිස්වරයාගේ ආනයනයන් අනුව ගලපන ලද රේගු සංඛ්‍යා

| | වටිනාකම රුපියල් දශ ලක්ෂ | |
|---|---|---|
| | 1966 | 1967 |
| 1. පාරිභෝගික භාණ්ඩ අතුරින් .. .. | 1,040 | 966 |
| (අ) ආහාරපාන .. .. | 835 | 818 |
| (i) සහල් .. .. | 266 | 244 |
| (ii) පිටි .. .. | 121 | 234 |
| (iii) සීනි (සුදු) .. .. | 75 | 71 |
| (ආ) රෙදිපිළි .. .. | 119 | 73 |
| (ඇ) වෙනත් පාරිභෝජන භාණ්ඩ .. | 86 | 75 |
| 2. අන්තර් භාණ්ඩ .. .. | 470 | 441 |
| 3. ආයෝජන භාණ්ඩ .. .. | 361 | 330 |
| 4. වර්ග නොකළ ආනයන .. .. | 36 | 36 |
| 5. එකතුව .. .. | 1,907 | 1,773 |

ගලපන ලද තොරතුරු අනුව බලන විට, 1967 මුළු ආනයන වටිනාකම, ඉකුත් වර්ෂයේ වටිනාකමින්, රුපියල් දශ ලක්ෂ 134 කින් හෙවත්, සියයට 7 කින් අඩු වී ගියේය. 'පාරිභෝගික භාණ්ඩ' ආනයනයන්හි වටිනාකම 1966 ට වඩා රුපියල් දශ ලක්ෂ 74 කින්, හෙවත් සියයට 7 කින් අඩු වුවද, සියයට 55 ක්වූ මුළු ආනයන කොටස ඉහත වර්ෂයේදීට වඩා වෙනසක් පෙන්නුම් කළේ නැත. 'අන්තර් භාණ්ඩ' සහ 'ආයෝජන භාණ්ඩ' අපනයනයන්, පිළිවෙලින්, රුපියල් දශ ලක්ෂ 29 කින් හෙවත් සියයට 6 කින් හා රුපියල් දශ ලක්ෂ 31 කින් හෙවත් සියයට 8 කින් පහළ ගිය අතර, ඒවායේ මුළු ආනයන කොටස පිළිවෙලින් සියයට 25 සහ සියයට 19 ඉහත වර්ෂයේ මට්ටම් හි නොවෙනස්ව පැවතුනි.

පාරිභෝගික භාණ්ඩ කොටසෙහි, ආනයනයන්හි වටිනාකම හීන වීම 'ආහාරපාන' රෙදිපිළි' සහ 'වෙනත් පාරිභෝගික භාණ්ඩ' යන උපකොටස් තුන මගින් එක්ව දරා ගනු ලැබීය.

II (එ) 9 වැනි සංඛ්‍යා සටහන මගින්, 1966 සහ 1967 වර්ෂයන් වෙනුවෙන් වූ, ආහාර කොමසාරිස් වරයාගේ සහ රේගු වාර්තාහි වාර්තා වුණු සහල්, පිටි සහ සීනි ආනයනයන්හි පරිමාවන්, වටිනාකම් සහ මිල සාමාන්‍යයන් දක්වා ඇත.

## සංඛ්‍යා සටහන II (එ) 9

## සහල්, තිරිඟු පිටි සහ ද්‍රව්‍යයන්ගේ රේගු සංඛ්‍යා සහ ඇත්ත වශයෙන් ලද ආනයන සංඛ්‍යා

| | ආහාර කොමසාරිස්වරයාගේ සංඛ්‍යා | | | | රේගු සංඛ්‍යා | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1966 | 1967 | වෙනස | | 1966 | 1967 | වෙනය | |
| | | | නියම | % ගණන | | | නියම | % ගණන |
| **සහල්** | | | | | | | | |
| ප්‍රමාණය | 494 | 381 | −113 | −22·9 | 682 | 349 | −333 | − 48·8 |
| වටිනාකම රු. දශලක්ෂ | 266 | 244 | − 22 | − 8·3 | 367 | 211 | −156 | − 42·5 |
| මි.ගැ. මිල රු. / ටොන් 1 ට | 538·45 | 640·80 | +102·35 | +19·0 | 537·60 | 603·01 | 65·41 | + 12·2 |
| **තිරිඟු පිටි** | | | | | | | | |
| ප්‍රමාණය | 264 | 517 | +253 | +95·8 | 237 | 505 | +268 | +113·1 |
| වටිනාකම රු. දශලක්ෂ | 121 | 234 | +113 | +93·4 | 113 | 229 | +116 | +102·7 |
| මි.ගැ. මිල රු. / ටොන් 1 ට | 458·79 | 453·26 | − 5·53 | − 1·2 | 479·00 | 452·74 | − 26·26 | − 5·5 |
| **සීනි** | | | | | | | | |
| ප්‍රමාණය | 233 | 226 | − 7 | − 3·0 | 304 | 243 | − 61 | − 20·1 |
| වටිනාකම රු. දශලක්ෂ | 75 | 71 | − 4 | − 5·3 | 103 | 74 | − 29 | − 28·2 |
| මි.ගැ. මිල රු. / ටොන් 1 ට | 323·36 | 313·70 | − 9·66 | − 3·0 | 338·00 | 302·53 | − 35·47 | − 10·5 |
| සහල්, තිරිඟු පිටි හා සීනිවල මුළු වටිනාකම | 462 | 549 | + 87 | +18·8 | 583 | 514 | − 69 | − 11·8 |

මූලය: ආහාර කොමසාරිස් තැනගේ දෙපාර්තමේන්තුව.
ලංකා රේගු වාර්තා.

1967 සංඛ්‍යා තොරතුරු දෙස බැලීමේදී, රුපියල් දශ ලක්ෂ 549 ක්වූ ආහාර කොමසාරිස්වරයාගේ සහල්, පිටි සහ සීනි ආනයනයන්හි නියම එකතුව, 1966 ට වඩා සැලකිය යුතු අන්දමින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 87 කින් හෙවත්, සියයට 19 කින් ඉහල ගියේය. ආහාර කොමසාරිස්වරයාගේ සහල් හා සීනි ආනයන්හි වටිනාකම, වන රුපියල් දශලක්ෂ 244 සහ රුපියල් දශලක්ෂ 71 ක, ඉකුත් වර්ෂයෙහි ඔහුගේ ආනයන අගයට වඩා පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 22 හෙවත්, සියයට 8 කින් සහ, රුපියල් දශ ලක්ෂ 4 හෙවත් සියයට 5 කින් අඩු විය. මේ අතර, රුපියල් දශ ලක්ෂ 234 ක්වූ පිටි ආනයනයන්හි වටිනාකම, 1966 දීට වඩා රුපියල් දශ ලක්ෂ 113 කින් හෙවත් සියයට 93 කින් වැඩිය.

විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළදී, වූ සහල් ආනයනයන්හි වටිනාකම හීන වූයේ, මෙම භාණ්ඩයේ ආනයන පරිමාවෙහි ටොන් 113 දහසක හෙවත්, සියයට 23 ක තියුණු පහල වැටීමක් හේතු කොට ගෙනය. මෙම බලපෑම, ඒවායේ සාමාන්‍ය මි. ගැ. මිල මට්ටම්, ටොන් එක රුපියල් දශ ලක්ෂ 102 කින් හෙවත් සියයට 19 කින් තියුණු ලෙස ඉහළ යාමෙන් තරමක් දුරට හිලව් වී යනු ඇත. 1967 සහල් ආනයන පරිමාව, 1966 පරිමාවට වඩා අඩු වූ අතර, මෙයට හේතු වූයේ විශේෂයෙන්, පාරිභෝගිකයින් වෙත සති පතා නිකුත් කළ පිහිටාධාර සහල් සලාකය සේරුවකින් අඩු කිරීම හා සම්බන්ධයෙන් රජය ගත් පියවර සහ දේශීය සහල් නිෂ්පාදන වැඩි කිරීම හා සම්බන්ධ ප්‍රතිපත්තීන් ය. සහල් වල සාමාන්‍ය මි. ගැ. මිලෙහි තියුණු ඉහළ යාම, ලෝක වෙළෙඳ පොලෙහි මිල උපනතීන් හා එකඟ වූ අතර, මෙය අඩු අස්වැන්න හා එයින් උද්ගත වූ හිඟකම් වල ප්‍රතිඵලයක් විය.

## ආනයන-ප්‍රධාන භාණ්ඩ ගණ සහ භාණ්ඩ හෝ

| | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 |
| 1. පාරිභෝගික භාණ්ඩ .. | 972 | 906 | 781 | 1,263 | 779 | 1,161 | 931 |
| (අ) ආහාර පාන .. | 672 | 630 | 629 | 1,008 | 604 | 956 | 783 |
| (I) සහල් .. | 217 | 195 | 192 | 326 | 144 | 367 | 211 |
| (II) පිටි .. | 69 | 71 | 60 | 137 | 98 | 113 | 229 |
| (III) (අ) සීනි (සුදු) .. | 77 | 56 | 70 | 185 | 71 | 103 | 74 |
| (ආ) සීනි, අනෙකුත් යක් කරා හකුරු සහ සුකිරි .. | 1 | 2 | 3 | 2 | 1 | 2 | ... |
| (IV) කිරි හා කිරි නිෂ්පාදිත .. | 66 | 76 | 77 | 94 | 77 | 77 | 66 |
| (V) මස්, මාළු හා බිත්තර .. | 77 | 62 | 65 | 74 | 61 | 101 | 56 |
| (අ) කරවල (උම්බලකඩ හැර එහෙත් වියලි ඉස්සන් ඇතුළුව) .. | 46 | 26 | 49 | 52 | 43 | 75 | 44 |
| (ආ) අනෙකුත් මාළු .. | 23 | 30 | 12 | 17 | 13 | 19 | 9 |
| (ඇ) මස් සහ පිළියෙල කළ මස් | 5 | 5 | 4 | 5 | 5 | 4 | 3 |
| (ඈ) බිත්තර .. | 3 | 1 | ... | — | ... | — | — |
| (VI) අනෙකුත් ආහාර .. | 133 | 139 | 139 | 164 | 124 | 170 | 126 |
| (අ) අර්තාපල් .. | 20 | 22 | 26 | 25 | 18 | 24 | 7 |
| (ආ) කඩල සහ ධාන්‍ය ඇටවර්ග | 42 | 45 | 39 | 51 | 39 | 64 | 53 |
| (ඇ) ලූණු .. | 21 | 20 | 22 | 26 | 21 | 20 | 19 |
| (ඈ) මිරිස් .. | 33 | 36 | 38 | 46 | 30 | 43 | 29 |
| (VII) බීම සහ සකස් කල දුම්කොළ | 10 | 5 | 5 | 3 | 2 | 2 | 2 |
| (ආ) රෙදිපිළි (ඇඳුම් ඇතුළුව) .. | 172 | 149 | 83 | 165 | 107 | 119 | 73 |
| (ඇ) අනෙකුත් පාරිභෝගික භාණ්ඩ .. | 128 | 127 | 69 | 90 | 68 | 86 | 75 |
| (I) මෝටර් රථ .. | 8 | 2 | 2 | 3 | 3 | 3 | 10 |
| (II) ඔර්ලෝසු .. | 3 | 2 | ... | ... | ... | ... | ... |
| (III) ගුවන් විදුලි යන්ත්‍ර .. | 3 | 1 | ... | ... | 1 | ... | ... |
| (IV) රබර් ටයර් සහ ට්‍යුබ් .. | 7 | 8 | 5 | 4 | 7 | 5 | 4 |
| (V) ඖෂධ සහ ඖෂධීය සංයෝග .. | 27 | 25 | 20 | 26 | 21 | 35 | 22 |
| 2. අන්තර් භාණ්ඩ .. | 383 | 409 | 372 | 397 | 414 | 470 | 441 |
| (I) පොහොර .. | 57 | 60 | 68 | 78 | 88 | 91 | 80 |
| (II) ඛනිජ තෙල් නිෂ්පාදිත .. | 127 | 126 | 119 | 93 | 109 | 130 | 112 |
| (III) ගල් අඟුරු .. | 9 | 9 | 9 | 12 | 10 | 3 | 9 |
| (IV) රසායනික ද්‍රව්‍ය සහ සංයෝග . | 27 | 33 | 32 | 37 | 30 | 36 | 38 |
| (V) ඩයි වර්ග .. | 11 | 15 | 10 | 12 | 9 | 13 | 10 |
| (VI) තේ සහ අනිකුත් ලී පෙට්ටි .. | 14 | 16 | 15 | 15 | 12 | 18 | 9 |
| (VII) කඩදාසි සහ කඩදාසි බෝඩ .. | 32 | 32 | 27 | 35 | 28 | 50 | 41 |
| (VI I) කැටි නූල් සහ නූල් .. | 23 | 22 | 13 | 22 | 41 | 42 | 45 |
| (IX) සකස් නොකළ දුම්කොළ .. | 12 | 10 | 9 | 7 | 9 | 8 | 6 |
| 3. ආයෝජන භාණ්ඩ .. | 339 | 337 | 324 | 305 | 261 | 361 | 330 |
| (I) ගොඩනැගිලි උපකරණ .. | 89 | 100 | 77 | 93 | 54 | 70 | 48 |
| (අ) සිමෙන්ති .. | 22 | 20 | 18 | 15 | 17 | 20 | 9 |
| (II) ගමනාගමන උපකරණ .. | 100 | 92 | 100 | 58 | 96 | 116 | 89 |
| (III) යන්ත්‍රෝපකරණ .. | 138 | 133 | 138 | 145 | 100 | 162 | 175 |
| 4. එකතුව (1, 2 හා 3 ශීර්ෂවල) .. | 1,694 | 1,652 | 1,477 | 1,965 | 1,454 | 1,992 | 1,702 |
| 5. වර්ග නොකළ ආනයන .. | 9 | 8 | 13 | 10 | 20 | 36 | 36 |
| 6. මුළු ආනයන .. | 1,703 | 1,660 | 1,490 | 1‘975 | 1,474 | 2,028 | 1,736 |

සංඛ්‍යා සටහන II (ඒ) 10

භාණ්ඩ වර්ග වශයෙන් 1961-1967

මුළු ආනයන වලින් සියයට ගණන

| 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 |
|---|---|---|---|---|---|---|
| 57·1 | 54·6 | 52·4 | 63·9 | 52·8 | 57·2 | 53·6 |
| 39·5 | 38·0 | 42·2 | 51·0 | 41·0 | 47·1 | 45·1 |
| 12·7 | 11·7 | 12·9 | 16·5 | 9·8 | 18·1 | 12·1 |
| 4·1 | 4·3 | 4·0 | 6·9 | 6·6 | 5·6 | 13·2 |
| 4·5 | 3·4 | 4·7 | 9·4 | 4·8 | 5·1 | 4·3 |
| | | | | | | |
| 0·1 | 0·1 | 0·2 | 0·1 | 0·1 | 0·1 | ... |
| 3·9 | 4·6 | 5·2 | 4·8 | 5·2 | 3·8 | 3·8 |
| 4·5 | 3·7 | 4·4 | 3·7 | 4·1 | 5·0 | 3·2 |
| | | | | | | |
| 2·7 | 1·6 | 3·3 | 2·6 | 2·9 | 3·7 | 2·5 |
| 1·4 | 1·8 | 0·8 | 0·9 | 0·9 | 0·9 | 0·5 |
| 0·3 | 0·3 | 0·3 | 0·3 | 0·3 | 0·2 | 0·2 |
| 0·2 | 0·1 | ... | — | ... | — | — |
| 7·8 | 8·4 | 9·3 | 8·3 | 8·4 | 8·4 | 7·2 |
| 1·2 | 1·3 | 1·7 | 1·3 | 1·2 | 1·2 | 0·4 |
| 2·5 | 2·7 | 2·6 | 2·6 | 2·6 | 3·1 | 3·0 |
| 1·2 | 1·2 | 1·5 | 1·3 | 1·4 | 1·0 | 1·1 |
| 1·9 | 2·2 | 2·6 | 2·3 | 2·0 | 2·0 | 1·7 |
| 0·6 | 0·3 | 0·3 | 0·2 | 0·1 | 0·1 | 0·1 |
| 10·1 | 9·0 | 5·6 | 8·4 | 7·3 | 5·9 | 4·2 |
| 7·5 | 7·7 | 4·6 | 4·6 | 4·6 | 4·2 | 4·3 |
| 0·5 | 0·1 | 0·1 | 0·2 | 0·2 | 0·1 | 0·6 |
| 0·2 | 0·1 | ... | ... | ... | ... | ... |
| 0·2 | 0·1 | ... | ... | 0·1 | ... | ... |
| 0·4 | 0·5 | 0·3 | 0·2 | 0·5 | 0·2 | 0·2 |
| 1·6 | 1·5 | 1·3 | 1·3 | 1·4 | 1·7 | 1·3 |
| 22·5 | 24·6 | 25·0 | 20·1 | 28·1 | 23·2 | 25·4 |
| 3·3 | 3·6 | 4·6 | 3·9 | 6·0 | 4·5 | 4·6 |
| 7·5 | 7·6 | 8·0 | 4·7 | 7·4 | 6·4 | 6·4 |
| 0·5 | 0·5 | 0·6 | 0·6 | 0·7 | 0·1 | 0·5 |
| 1·6 | 2·0 | 2·1 | 1·9 | 2·0 | 1·8 | 2·2 |
| 0·6 | 0·9 | 0·7 | 0·6 | 0·6 | 0·6 | 0·6 |
| 0·8 | 1·0 | 1·0 | 0·8 | 0·8 | 0·9 | 0·6 |
| 1·9 | 1·9 | 1·8 | 1·8 | 2·9 | 2·5 | 2·4 |
| 1·4 | 1·3 | 0·9 | 1·1 | 2·8 | 2·1 | 2·6 |
| 0·7 | 0·6 | 0·6 | 0·4 | 0·6 | 0·4 | 0 3 |
| 19·9 | 20·3 | 21·7 | 15·4 | 17·7 | 17·8 | 19·0 |
| 5·2 | 6·0 | 5·2 | 4·7 | 3·3 | 3·4 | 2·8 |
| 1·3 | 1·2 | 1·2 | 0·8 | 1·2 | 1·0 | 0·5 |
| 5·9 | 5·5 | 6·7 | 2·9 | 6·5 | 5·7 | 5·1 |
| 8·1 | 8·0 | 9·3 | 7·3 | 6·8 | 8·0 | 10·1 |
| 99·5 | 99·5 | 99·1 | 99·5 | 98·6 | 98·2 | 97·9 |
| 0·5 | 0·5 | 0·9 | 0·5 | 1·4 | 1·8 | 2·1 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |

මූලය: රේගු වාර්තා

පිටි ආනයනයන්හි වටිනාකමෙහි රුපියල් දශ ලක්ෂ 93 ක විශාල වැඩිවීම, ආනයනය කළ ප්‍රමාණය ටොන් 253 දහසකින් හෙවත් සියයට 96 කින් ඉහළ යාම මගින් පැහැදිලි වේ. ටොන් එක රුපියල් 453 ක්වූ සාමාන්‍ය මි. ගැ. මිල, 1966 සාමාන්‍ය මිලට වඩා ටොන් එකක් රුපියල් 6 කින් හෙවත් සියයට 1 කින් පහළ වැටීමක් පෙන්නුම් කළේය. විමර්ශනයට ලක්ව ඇති වර්ෂය තුළදී පිටි ආනයනයන්හි ඉහළ යාම, 1966 දෙසැම්බරයේ දී සති පතා දෙන පිහිටාධාර සහල් සලාකය අඩු කිරීමෙන් අනතුරුව, පිටි සඳහා බලාපොරොත්තු වූ ඉහළ ඉල්ලුම ඉටු කිරීම පිණිස සිදු වූවකි. 1967 වර්ෂයේ නියම පිටි පාරිභෝජනය ඉහළ ගිය අතර, ආනයන ප්‍රමාණය වැඩි වූ හෙයින් එසේ ඉහළ ගිය පාරිභෝජනය පිරිමැසීමට පමණක් නොව, වර්ෂයේ ටොන් 74,000[1] කින් ඉහළ ගිය තොග රැස් කිරීමට ද සැහිණ.

1966 හා සැසඳීමේ දී, 1967 දී සීනි ආනයනයන්හි වටිනාකම පහළ වැටුනේ, සීනි ආනයන පරිමාව ටොන් 7 දහසකින් හෙවත් සියයට 3 කින් සංකෝචනය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සහ ටොන් එක රුපියල් 10 කින් හෙවත් සාමාන්‍ය මි. ගැ. මිල සියයට 3 කින් පහළ වැටීමේ ප්‍රතිඵලයක් වශයෙනි. සීනි මිල පහළ වැටීම, ජාත්‍යන්තර වෙළඳපොල වල් වල සීනි වැඩි ප්‍රමාණයකින් පැවතීම නිසා විය.

II (එ) 10 සංඛ්‍යා සටහනෙන්, රේගු වාර්තාවන්හි දැක්වෙන අයුරු ආනයනයන්, ප්‍රධාන අංශ වශයෙන්, භාණ්ඩ හෙවත් භාණ්ඩ වර්ග කොටස් අනුව වෙන් කොට දක්වා ඇත.

1967 දී සටහන් වූ රුපියල් දශ ලක්ෂ 290 ක මුළු ආනයනයන්ගේ වටිනාකමෙහි හීනවීම ප්‍රධාන ආනයනයන් තෙවර්ගය විසින් සමාන අන්දමින් විඳ දරා ගෙන ඇත. වඩා විශාල වැටීමකට දක්නට ලැබුණේ, ඉහත වර්ෂයේ මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 230 කින් හෙවත් සියයට 20 කින් හීන වූ 'පාරිභෝගික භාණ්ඩ' වගී ආනයනයන් සම්බන්ධයෙන් ය. 1966 දී මුළු ආනයනයන්ගෙන් සියයට 57 ක ප්‍රමාණයක් වූ මෙම භාණ්ඩ කොටස, 1967 දී සියයට 3 කින් අඩු වී, සියයට 54 දක්වා පහළ වැටුණි. පසුගිය වර්ෂයේ මට්ටමින් 'අන්තර්' සහ 'ආයෝජන භාණ්ඩ' ආනයන වටිනාකම් පිළිවෙලින්. රුපියල් දශ ලක්ෂ 29 කින් හෙවත් සියයට 6 කින් හා රුපියල් දශ ලක්ෂ 31 කින් හෙවත් සියයට 9 කින් අඩු විය. මුළු ආනයනයන්හි ඒවායේ කොටස් ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 2 කින් සහ සියයට 1 කින් වැඩි වී, විමර්ශනයට ලක්ව ඇති වර්ෂයේ දී පිළිවෙලින් සියයට 25 ක් සහ සියයට 19 ක් වුණි.

"පාරිභෝගික භාන්ඩයන්"හි ආනයන වටිනාකමෙහි විශාලම පහල වැටීම, ප්‍රධාන වශයෙන්ම "ආහාරපාන[2]' වගී ආනයනයන් අඩුවීම හේතු කොට ගෙන සිදුවීය. රුපියල් දශලක්ෂ 783 ක්ව පැවැති මෙම ආනයනයන් ප්‍රමාණය 1966 මට්ටමින් රුපියල් දශලක්ෂ 173 කින් හෙවත්, සියයට 18 කින් පහල වැටුනේ, රේගු වාර්තාවන් අනුව, රජයේ, සහල්, පිටි සහ සීනි මුළු ආනයනයන් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 69 කින් හෙවත් සියයට 12 කින් පහල වැටීමේ හේතුවෙනි. කෙසේ වෙතත් මෙම භාණ්ඩවල නියම ආනයන ප්‍රමාණයන්හි වෙනස්කම්, රේගු සටහන්වල දක්වනවාට වඩා වෙනස්වූ අතර, ඒවා මතු ඡේදයන්හි දක්වා ඇත. රුපියල් දශලක්ෂ 66 ක්ව පැවති "කිරි සහ කිරි ද්‍රව්‍ය" ආනයනයන් 1966 මට්ටමින් රුපියල් දශලක්ෂ 11 කින් හෙවත්, සියයට 14 කින් පහල වැටුන අතර 'මස් හා මාළු' ආනයනයන්ද 1967 දී රුපියල් දශලක්ෂ 56 දක්වා, රුපියල් දශලක්ෂ 45 කින් හෙවත්, සියයට 45 කින් පහල වැටුනි. රුපියල් දශලක්ෂ 126 ක්වූ 'අනිකුත් ආහාර ද්‍රව්‍ය' ආනයන වටිනාකම (මෙයට අර්තාපල්, කඩල, ඇට වගී සහ කුළු බඩු ඇතුළත් වේ.) රුපියල් දශලක්ෂ 44 ක හෙවත් සියයට 26 ක පහල වැටීමක් සටහන් කළේය. මෙම උප කොටසෙහි ආනයන

1. ආහාර කොමසාරිස් වරයාගේ දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ආසන්න සංඛ්‍යා අනුව.

වටිනාකම්හි පහලවැටීමට තරමක් දුරට හේතුවූයේ, 1967 මැයි මාසයේ දී අර්තාපල් ආනයන අත්හිටු විමය. වියලි මිරිස් ආනයනයන්ද අඩුකරනු ලැබීය. මෙම විධිවිධානයන් යොදන ලද්දේ මෙම භාණ්ඩයන්හි දේශීය නිෂ්පාදකයන්ට අනුබලයක් දීමේ අදහසින් යුතුවය. 1966 හා සැසඳීමේදී ඇටවගී ආනයනයන් හි වටිනාකම 1967 දී පහල වැටීම, සිරියාවේ අසතුටුදායක අස්වැන්න හේතුවෙන් ලෝක වෙළඳ පොල වල, මෙම ඇටවගී සැපයුම අඩුවීම නිසාය. අනෙක් "පාරිභෝගික භාණ්ඩ" උප කොටස් දෙක සම්බන්ධයෙන් බැලීමේදී, 1967 දී රුපියල් දශලක්ෂ 73 ක්වූ රෙදිපිළි ද්‍රව්‍ය ආනයනයන්හි වටිනාකම ඉහත වර්ෂයේ මට්ටමින් රුපියල් දශලක්ෂ 46 ක හෙවත් සියයට 39 ක පහල වැටීමක් සටහන් කල බව පෙනේ. මුළු ආනයනයන්ගෙන් සියයට 4 ක් වූ "රෙදිපිළි ද්‍රව්‍ය" කොටස සියයට 2 කින් අඩුවිණි. අනික් අතට "වෙනත් පාරිභෝගික භාණ්ඩ" වටිනාකම් අනුව,.බැලීමේ දී එතරම් තියුණු අන්දමින් අඩු නොවූ අතර, 1967 දී රුපියල් දශලක්ෂ 75 ක්වූ මෙය 1966 මට්ටමින් රුපියල් දශලක්ෂ 11 ක හෙවත් සියයට 13 ක වැටීමක් පල කළේය. මුළු ආනයනයන්ගෙන් ද සියයට 4 ක්ව පැවැති මෙම ආනයන ,කොටස පසුගිය වර්ෂයට වැඩි වෙනසක් පෙන්වූයේ නැත. "වෙනත් පාරිභෝගික භාණ්ඩ" උප ශීර්ෂයන්හි දක්වෙන 'බෙහෙත් හා ඖෂධීය ද්‍රව්‍ය' සහ 'රබර් ටයර් සහ ටියුබ්' ආනයන පිළිවෙලින්, රුපියල් දශලක්ෂ 13 කින් හෙවත් සියයට 37 කින් සහ රුපියල් දශලක්ෂ 1 කින් හෙවත් සියයට 20 කින් අඩු වුවත්, එහි බලපෑම කාර් ආනයනයන්ගේ වටිනාකම රුපියල් දශලක්ෂ 7 කින් වැඩිවීමෙන්, තරමක් දුරට හෝ හිලව් වි ගියේය.

'අන්තර් භාණ්ඩ' වශයෙහි එන "ඛනිජතෙල් නිෂ්පාදන" ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 112 ක ප්‍රමාණයක් වූ අතර, මෙම පසුගිය වර්ෂයේ මට්ටමින් රුපියල් දශලක්ෂ 18 ක හෙවත් සියයට 14 ක වැටීමක් පෙන්වූයේය. මුළු ආනයන ප්‍රමාණය වූ ගැලොම් දශලක්ෂ 266, ගැලොම් දශලක්ෂ 42 කින් හෙවත් සියයට 14 කින් අඩුවූ අතර, ගැලොම ශත 42 ක්වූ සාමාන්‍ය මි: ගැ: මිල 1966 සාමාන්‍ය මිලට වඩා සියයට 2කින් ඉහල ගියේය. 1967 දී 'පොහොර ද්‍රව්‍ය' ආනයනයන්ද පහල ගිය අතර, රුපියල් දශලක්ෂ 80 ක් සටහන් වූ මෙම ආනයනයන්හි වටිනාකම රුපියල් දශලක්ෂ 11 ක හෙවත් සියයට 12 ක වැටීමක් සටහන් කලාය. 1967 දී රට තුලට ගෙන්වනු ලැබූ ටොන් 309 දහසක් වූ පොහොර ආනයන පරිමාව, ටොන් 17 දහසක හෙවත් සියයට 6 ක වැටීමක් දක් වූ අතර, ටොන් එක රුපියල් 262 ක් වූ එහි සාමාන්‍ය මි. ගැ. මිල ටොන් එක රුපියල් 21 කින් හෙවත් සියයට 7 කින් අඩුවුනි. 1967 දී 'ගල් අඟුරු' ආනයනයන් රුපියල් දශලක්ෂ 6, රුපියල් දශලක්ෂ 9 දක්වා ඉහල ගිය අතර, 'කපුනූල්' සහ 'නූල්' ආනයනය රුපියල් දශලක්ෂ 45 දක්වා, රුපියල් දශලක්ෂ 3 කින් ඉහල ගියේය. 'අන්තර් භාණ්ඩ' වශයෙහි අනිකුත් ප්‍රධාන වෙනස්කම් අතර, 'කඩදාසි සහ සණ කඩදාසි' ආනයනයන්හි ද, 'තේ සහ වෙනත් පෙට්ටි' ආනයනයන්හිද, 'සායම් පෙවීමේ සහ සම් පදම් කිරීමේ' භාණ්ඩ ආනයනයන්හි වටිනාකම් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 9 කින් හෙවත් සියයට 18 කින් ද. රුපියල් දශලක්ෂ 9 කින් හෙවත් සියයට 50 කින්ද, රුපියල් දශලක්ෂ 3 කින් හෙවත් සියයට 23 කින් ද අඩු විය.

'අයෝජන භාණ්ඩ' යටතේ වූ "ගොඩනැගිලි උපකරණ" සහ "ප්‍රවාහණ උපකරණ" ආනයනයන් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 22 කින් හෙවත් සියයට 31 කින් සහ රුපියල් දශලක්ෂ 27 කින් හෙවත් සියයට 23 කින් පහළ වැටුනි. අනික් අතට,"යන්ත්‍රෝපකරණ" ආනයනයන් හි රුපියල් දශලක්ෂ 13 ක හෙවත් සියයට 8 ක ප්‍රසාරණයක් නිරූපනය වීය. "ගොඩනැගිලි උපකරණ" උප කොටස් යටතේ එන, රුපියල් දශලක්ෂ 9 ක්ව පැවැති සිමෙන්ති ආනයන වටිනාකම ඉහත වර්ෂයේ සංඛ්‍යාවෙන් රුපියල් දශලක්ෂ 11 කින් හෙවත් සියයට 55 කින් පහළ වැටුණු අතර, මෙයට බොහෝ සේ හේතු වූයේ, 1966 දී ටොන් 247 දහස, 1967 දී ටොන් 99 දහස

දක්වා පරිමාව තියුණු අන්දමින් සංකෝචනය වීමය. කෙසේ වුවද, සිමෙන්තිවල සාමාන්‍ය මි. ර. ගැ. මිල ටොන් එක රු. 90 දක්වා රුපියල් 9 කින් ඉහළ ගිය අතර, එමගින් ආනයන පරිමාව අඩුවීමකින් ආනයන වටිනාකම වෙත වූ බලපෑම් සුළු වශයෙන් මගහැරී ගියේ ය.

මහ බැංකුවේ දර්ශකයෙන් මනින විට මුළු ආනයන පරිමාව පිළිබඳ මහ බැංකු දර්ශකය, වර්ෂය තුළ දී තියුණු අන්දමින් පහළ වැටුණු අතර, 85 ක්වූ එය (පාදය 1958=100) පසුගිය වර්ෂයට වඩා සියයට 21 ක වැටීමක් දක්වුනි. ප්‍රධාන ආනයන වර්ගයන් සඳහා වෙන් වෙන් වශයෙන් වූ දර්ශකයන් පෙන්වන පරිදි, මෙම පරිමාවෙහි වූ සංකෝචනය ප්‍රධාන අනයනයන්හි වූ පාරිභෝගික භාණ්ඩයන්හි පරිමා දර්ශකය 79 දක්වා සියයට 20 කින් අඩු වූ අතර, අන්තර් භාණ්ඩ පිළිබඳ දර්ශකයන්, පිළිවෙළින් 128 සහ 65 දක්වා සියයට 14 කින් සහ 37 කින් පහළ වැටුනි. පාරිභෝගික භාණ්ඩ කොටසෙහි පරිමාව අඩුවීම "ආහාර පාන" සහ 'රෙදිපිළි" උප කොටස් වලට සීමා වූ අතර, මේවායේ දර්ශකයන්, පිළිවෙළින් 103 දක්වා සියයට 21 කින් සහ 39 දක්වා සහ සියයට 43 කින් පහළ වැටුනි. "වෙනත් පාරිභෝගික භාණ්ඩ" දර්ශකය, කෙසේ වෙතත්, 35 දක්වා සියයට 35 කින් ඉහළ ගියේ ය.

පසුගිය වර්ෂ හතර තුළ දී දිගින් දිගට ඉහළ ගිය මුළු ආනයනයන්හි සාමාන්‍ය මිල විමර්ශනයන්ට භාජනයවන වර්ෂ තුළ දී තවදුරටත් ඉහළ ගියේය. ආනයන මිල පිළිබඳ මහ බැංකුවේ දර්ශකය 1967 දී 123 ක් වූ අතර, 1966 ට වඩා සියයට 3කින් වැඩි විය. ප්‍රධාන වර්ගයේ ආනයනයන්හි මිල දර්ශකයන් මගින් පෙනී යන පරිදි, පාරිභෝගික භාණ්ඩ ආයෝජන භාණ්ඩ පිළිබඳ දර්ශකයන් පිළිවෙළින් සියයට 3 කින් සියයට 10 කින්, 114 සිට 204 දක්වා ඉහළගිය අතර. අන්තර් භාණ්ඩ මිල දර්ශකය 86 දක්වා සියයට 8 කින් පහළ වැටුනි. පාරිභෝගික භාණ්ඩ කොටස තුළ වූ උප කොටස් දෘනට මිල ඉහළ යාම් සටහන් කළේය. "ආහාර පාන" සහ "රෙදිපිළි" මිල දර්ශකයන් පිළිවෙළින් 110 සහ 101 දක්වා සියයට 2 කින් සහ සියයට 5 කින් ඉහළ ගිය අතර, වෙනත් පාරිභෝගික දර්ශකය 135 දක්වා සියයට 2කින් ඉහළ ගියේ ය.

**කොළඹ වරායේ සිදු වූ වර්ධනයන්**

1966 වාර්ෂික වාර්තාව මගින් එම වර්ෂය තුළ දී කොළඹ වරායෙහි බඩු තොග කටයුතු සම්බන්ධයෙන් සැලකිය යුතු වර්ධනයක් තිබූ බව පෙන්වා දුනි. 1967 දි වරායේ තත්ත්වයෙහි තවත් වර්ධනයක් දකින්නට හැකි විය.

වර්ෂය මුළුල්ලේ කොළඹ වරායට සේන්දු වූ නැව් ප්‍රමාණය සියයට 2 කින් ඉහළ යාමත් සමගම, බඩු බා එකි නැව් වරායෙන් පිටවීම ද සැලකිය යුතු වේගයකින් සිදු වූ අතර, 1966 දී වරාය තුළ එම නැව් නවතා තුබූ සාමාන්‍ය කාලය වන දින 7·5, 1967 දී 7·1 දක්වා පහළ වැටුනි. මෙය වනාහි සියයට 5ක වර්ධනයකි.[1] කෙසේ

1. 1966 හා සැසඳීමෙදී 1967 දී කොළඹ වරායට පැමිණි නැව් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

**1966 සහ 1967 සාමාන්‍ය නැව් බඩු ගෙන ආ යාත්‍රාවන්හි තික්ම යෑම**

| වර්ෂය | නැව් (ටොන් 50 ට වැඩි) | එක් නැවක් පැමිණි වේලේ සිට වැඩ අරඹන තෙක් වරාය කුළ නවතා තිබූ සාමාන්‍ය කාල සීමාව (දින) | එක් නැවක බඩු බා අවයන් කිරීමට ගනවූ සාමාන්‍ය කාලය (දින) | එක් නැවක් රැඳි සිටි සාමාන්‍ය කාලසීමාව (දින) |
|---|---|---|---|---|
| 1966 | 632 | 0·47 | 7·02 | 7·5 |
| 1967 | 644 | 0·39 | 6·75 | 7·1 |

මූලය : වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය.

වුවද, වරාය තුළ හැසිරවුනු මුළු බඩු තොග පරිමාව ඉහත වර්ෂය හා සැසැඳීමේ දී 1967 දී නාවික ටොන් 1,20,721 හෙවත් සියයට 4 ක පහළ වැටීමක් සටහන් කළහ. හසුරුවන ලද මුළු බඩු තොග පරිමාව අඩුවූයේ, 1967 තුළදී ආනයන බඩු තොග පරිමාව සියයට 7 කින් හෙවත් නාවික ටොන් 1,84,997 කින් සංකෝචනය වීම හේතු කොට ගෙන ය. මෙකී බලපෑම, වර්ෂය තුළදී හසුරුවනු ලැබූ නිර්යාත නැව් භාණ්ඩ පරිමාව සියයට 6 කින් හෙවත් නාවික ටොන් 44,276 කින් වැඩිවීම මගින් තරමක් දුරට මගහැරී ගියේ ය.[1]

1967 දී හසුරුවනු ලැබූ ආනයන බඩු තොග පරිමාවෙහි සංකෝචනය වීම, මුළු ආනයන පරිමාවේ තියුණු අන්දමින් හීනවීම නිසා සිදු වූවකි. (මහ බැංකු වෙළෙඳ දර්ශකයන් මගින් මිණූ පරිදි)

1967 ජූනි මාසයේ දී මැද පෙරදිග උද්ගත වූ විරුද්ධවාදී කම්වල ප්‍රතිඵලය වූයේ සූවස් ඇල මාර්ගය වසා දැමීමය. මෙම වසා දැමීම සමගම නැව් මාගීය කේප්තුඩුව වටා දික්වීමත්, නැව් සමාගම් 1965 දී පනවා, නැවත ඉවත් කර ගත් අමතර ගාස්තුව නැවත පැනවූයේය.[2] 1967 නොවැම්බරයේ දී ස්ටර්ලින් පවුම අවප්‍රමාණය කිරීමත් සමග ම ස්ටර්ලින් මුදල් අනුව දක්වුනු නැව් ගාස්තු වෙනස්කමින්, ඔවුන් විසින් අතිරේක අවප්‍රමාණ කිරීමේ අමතර ගාස්තුවක් යොදවන ලදී.

---

1. 1966 අනුරූප කාර්තුව හා සැසැඳීමේ දී, මෙම වසරේ එක් එක් කාර්තුව තුළ දී කොළඹ වරාය මගින් හසුරුවන ලද ටොන් ප්‍රමාණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

**ආනයන හා අපනයන නැව් බඩු**

නැව් ටොන්

| | 1966 | 1967 | වෙනස | |
|---|---|---|---|---|
| | | | නියම | % |
| 1 වැනි කාර්තුව ... | 7,46,429 | 8,43,299 | + 96,870 | + 13·0 |
| 2 වැනි කාර්තුව .... | 7,74,607 | 7,20,255 | − 54,352 | + 7·0 |
| 3 වැනි කාර්තුව . | 7,58,044 | 6,71,137 | − 86,907 | − 11·5 |
| 4 වැනි කාර්තුව .... | 7,76,133 | 6,99,801 | − 76,332 | − 9·8 |
| වර්ෂයේම.... | 30,55,213 | 29,34,492 | − 1,20,721 | − 4·0 |

මූලය : වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය.

2. මෙම අමතර ගාස්තු වැඩිවීම පිළිබඳ විස්තර පහත දැක්වේ –

**(I) ලංකා / බ්‍රිතාන්‍ය සහ අයර් සම්මුතිය**

1967 ජූනි 8 වැනිදා -ලංකාවට ගෙන්වන සියළු ම ආනයන වෙනුවෙන් සියයට 17½ ක, කේප්තුඩුව වටා හැරවීමේ අමතර ගාස්තුවක් නියම විය.

1967 ජූනි 13 වැනිදා -ලංකාවෙන් යැවුන සියළු ම අපනයනයන් වෙනුවෙන් සියයට 17½ ක කේප්තුඩුව වටා හැරවීමේ අමතර ගාස්තුවක් නියම විය.

1967 සැප්තැම්බර් 5 වැනිදා -ආනයන සහ අපනයන දෙවර්ගය ම වෙනුවෙන් වූ කේප්තුඩුව වටා හැරවීමේ අමතර ගාස්තුව සියයට 15 දක්වා අඩු කැරුනි.

1967 නොවැම්බර් 26 වැනිදා - ලංකාවෙන් යැවුනු සියළු ම අපනයනයන් වෙනුවෙන් සියයට 9 ක අවප්‍රමාණ කිරීමේ අමතර ගාස්තුවක් නියම විය.

(II) ලංකාව / මහාද්වීපික සම්මුතිය

1967 ජූනි 8 වැනිදා - ලංකාවට ගෙන්වන සියළු ම ආනයනයන් වෙනුවෙන් සියයට $17\frac{1}{2}$ ක අමතර ගාස්තුවක් නියම විය.

1967 ජූනි 13 වැනිදා - ලංකාවෙන් යැවුනු සියළු ම ආනයනයන් වෙනුවෙන් සියයට $17\frac{1}{2}$ ක අමතර ගාස්තුවක් නියම විය.

1967 සැප්තැම්බර් 5 වැනිදා - ආනයන සහ අපනයන දෙවර්ගය ම වෙනුවෙන් වූ කෝප්තුඩුව වටා හැරවීමේ අමතර ගාස්තුව සියයට 15 දක්වා අඩු කැරුනි.

1967 නොවැම්බර් 26 වැනිදා - ලංකාවෙන් යැවුනු සියළුම අපනයනයන් වෙනුවෙන් සියයට 9 ක අවප්‍රමාණය කිරීමේ අමතර ගාස්තුවක් නියම විය.

(III) ලංකා / ඇමරිකානු සම්මුතිය

1967 ජූනි 12 වැනිදා - ලංකාවට ගෙන්වන සියළු ම ආනයනයන් වෙනුවෙන් සියයට 26 ක කෝප්තුඩුව වටා හැරවීමේ අමතර ගාස්තුවක් නියම විය.

1967 ජූනි 13 වැනිදා - ලංකාවෙන් යැවුනු සියළු ම අපනයනයන් වෙනුවෙන් සියයට $17\frac{1}{2}$ ක කෝප්තුඩුව වටා හැරවීමේ අමතර ගාස්තුවක් නියම විය.

1967 සැප්තැම්බර් 23 වැනිදා - ලංකාවට ගෙන්වන සියළු ම ආනයනයන් වෙනුවෙන් වූ කෝප්තුඩුව වටා හැරවීමේ අමතර ගාස්තුව සියයට 20 දක්වා අඩු කරනු ලැබීය.

1967 නොවැම්බර් 1 වැනිදා - ආනයන හා අපනයන දෙවර්ගය ම වෙනුවෙන් වූ කෝප්තුඩුව වටා හැරවීමේ අමතර ගාස්තුව සියයට 15 දක්වා අඩු කැරිනි.

(IV) ලංකා / කැනේඩියානු (අත්ලාන්තික්) සම්මුතිය

1967 ජූලි 24 වැනිදා - ලංකාවෙන් යැවුනු සියළුම අපනයනයන් වෙනුවෙන් සියයට 15 ක කෝප්තුඩුව වටා හැරවීමේ අමතර ගාස්තුවක් නියම විය.

(V) ලංකා / ඕස්ට්‍රේලියානු සම්මුතිය

1967 නොවැම්බර් 25 වැනිදා - ලංකාවෙන් යැවුනු සියළුම අපනයනයන් වෙනුවෙන් සියයට $12\frac{1}{2}$ ක අවප්‍රමාණය කිරීමේ අමතර ගාස්තුවක් නියම විය.

(VI) ලංකා / නිව්සීලන්ත සම්මුතිය

1967 නොවැම්බර් 26 වැනිදා - ලංකාවෙන් යැවුණු සියළුම අපනයනයන් වෙනුවෙන් සියයට 5 ක අවප්‍රමාණය කිරීමේ අමතර ගාස්තුවක් නියම විය.

(VII) ලංකා / සිංගප්පූරු / චීන හා ජපන් අනුපානික ගිවිසුම

1967 නොවැම්බර් 26 වැනිදා - ලංකාවෙන් යැවුනු සියළුම අපනයනයන් වෙනුවෙන් සියයට $16\frac{2}{3}$ ක අවප්‍රමාණය කිරීමේ අමතර ගාස්තුවක් නියම විය.

### වෙළෙඳ රටාව

1967 තුළදී, ප්‍රධාන මුදල් කලාපයන් වෙත යැවුනු ලංකාවේ අපනයනයන්හි වටිනාකම විවිධ ප්‍රමාණයන්ගෙන් ඉහළ ගියේය. මෙසේ නොවූයේ ස්ටර්ලින් කලාපය සම්බන්ධයෙන් පමණි. අනෙක් අතට, ඩොලර් කලාපය හා යුරෝපීය ආර්ථික හවුලට හැරුණුවිට අනෙක් කලාප හා ප්‍රදේශ වලින් පැමිණි ආනයන පහළ ගියේය. II (එ) 11 වැනි සංඛ්‍යා සටහනින්, ප්‍රධාන මුදල් කලාප අනුව වෙළෙඳ රටාව පෙන්වා දී ඇත.

**සංඛ්‍යා සටහන II (එ) 11**

**මුදල් කලාප හා ප්‍රදේශ අනුව ලංකාවේ විදේශියන්හි කළ භාණ්ඩ වෙළෙඳම**

රුපියල් දශ ලක්ෂ

| | මුළු අපනයන (අ) නැ. වි. ස. | | මුළු ආනයන මි. ර. ගැ. | | වෙළෙඳ ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | 1966 | 1967 | 1966 | 1967 | 1966 | 1967 |
| ස්ටර්ලිංග් කලාපය .. .. | 846·4 | 795·3 | 904·2 | 615·8 | – 57·8 | +179·5 |
| ඩොලර් කලාපය .. .. | 196·3 | 205·6 | 113·1 | 124·0 | + 83·2 | + 81·6 |
| වෙනත් .. .. | 637·1 | 636·0 | 1,011·0 | 998·6 | –373·9 | –362·6 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් | 686·4 | 750·8 | 739·9 | 623·3 | – 53·5 | +127·5 |
| විදේශීය රටවල් (ආ) .. .. | 993·4 | 886·1 | 1,288·4 | 1,115·1 | –295·0 | –229·0 |
| යුරෝපීය ආර්ථික හවුල (ඇ) | 128·5 | 139·9 | 220·4 | 269·4 | – 91·9 | –129·5 |
| යුරෝපීය නිදහස් වෙළෙඳ ප්‍රදේශය (ඈ) .. .. | 426·3 | 483·7 | 381·8 | 312·5 | + 44·5 | +171·2 |
| ආ.ඈ.පෙ.ආ.කො. (ඉකැෆේ) දිශාව (ඉ) .. .. | 433·3 | 398·5 | 985·8 | 736·2 | –552·5 | –337·7 |

මූලය: රේගු වාර්තා.

(අ ) නැව්වල ස්ටෝරු සහ බංකර.
(ආ) 1965 සිට, දකුණු අප්‍රිකානු සංගමය සමග වූ වෙළෙඳ කටයුතු අන්තර්ගත වේ.
(ඇ) බෙල්ජියම, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, ලක්ෂම්බර්ග් සහ නෙදර්ලන්තය.
(ඈ) ඔස්ට්‍රියාව, ඩෙන්මාර්කය; නෝර්වේ, පෘතුගාලය, ස්වීඩනය, ස්විට්සර්ලන්තය සහ එක්සත් රාජධානිය.
(ඉ ) ඇෆ්ගනිස්ථානය, ඔස්ට්‍රේලියාව, (1964 ට පසුව) බෲනෙයි, බුරුමය, කාම්බෝජය, ලංකාව, මහජන චීන සමූහාණ්ඩුව, ටයිවානය, මැලේසියාව (මලයාව්, උතුරු බෝනියෝ සහ කරාවාක්) හොංකොං, ඉන්දියාව, ඉන්දුනීසියාව, අයිරානය, ජපානය, උතුරු කොරියාව, දකුණු කොරියාව, ලාඕස්, මොංගෝලියාව, නේපාලය, නවසීලන්තය (1964 ට පසු) තායිලන්තය, උතුරු වියට්නාමය, දකුණු වියට්නාමය.

වර්ෂය තුළ දී ස්ටර්ලින් කලාපයට යැවුනු අපනයනයන්හි වටිනාකම රුපියල් දශ ලක්ෂ 795 ක් වූ අතර, මෙය පසුගිය වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 51 ක හෙවත් සියයට 6 ක අඩුවීමකි. ලංකාවේ මුළු අපනයන ප්‍රමාණයෙන් මෙම කලාපයේ කොටස වූ සියයට 47 ද සියයට 3 කින් පහළ වැටුනි. රුපියල් දශලක්ෂ 616 ක් වූ මෙම කලාපයේ ආනයන ප්‍රමාණය රුපියල් දශලක්ෂ 288 කින් හෙවත් සියයට 32 කින් වඩා තියුණු අන්දමින් පහළ බැස්සේය. ලංකාවේ මුළු ආනයනයන්ගෙන්, ස්ටර්ලිං කලාපයේ කොටස 1967 දී සියයට 35 දක්වා සියයට 12 කින් අඩුවුනි. 1967 දී කලාපය හා වූ වෙළෙඳ ශේෂය රුපියල් දශලක්ෂ 180 ක අතිරික්තයක් සටහන් කළ අතර, 1966 දී මෙය රුපියල් දශලක්ෂ .58 ක හිඟය දක්විය. රුපියල් දශලක්ෂ 206 ක් ව පැවැති, ඩොලර් කලාපය වෙත යැවුනු අපනයනයන් ප්‍රමාණය 1966 ට වඩා රුපියල් දශලක්ෂ 10 කින් හෙවත් සියයට 5 කින් වැඩි විය. කලාපයෙන් ගෙන් වුනු ආනයන ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 124 ද, සියයට 10 ක හෙවත් රුපියල් දශලක්ෂ 11 ක වැඩිවීමක් සටහන් කළේය. මුළු ආනයනයන්ගෙන් ඩොලර් කලාපයේ කොටස වූ සියයට 12,

1966 හා සැසැඳීමේ දී වෙනසක් පෙන්වූයේ නැති අතර, මුළු ආනයන වල ඇයගේ කොටස වූ සියයට 7 ආන්තික වශයෙන් සියයට 1 කින් වැඩි විය. ඩොලර් කලාපය සමග වූ වෙළෙඳ ශේෂයේ අතිරික්තය වන රුපියල් දශලක්ෂ 82 වනාහි 1966 ට වඩා රුපියල් දශලක්ෂ 1 ක අඩුවීමක් විය.

රුපියල් දශලක්ෂ 751 ක් ව පැවැති පොදු රාජ්‍ය මණ්ඩලයට යැවුනු අපනයන වටිනාකම, පසුගිය වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 65 කින් හෙවත් සියයට 9 කින් වැඩි වූ අතර, රුපියල් දශලක්ෂ 623 ක් ව පැවැති ආනයන වටිනාකම රුපියල් දශලක්ෂ 117 කින් හෙවත් සියයට 16 කින් තියුණු අන්දමින් පහළ ගියේය. මුළු අපනයනයන්ගේ පොදු රාජ්‍ය මණ්ඩලයේ කොටස වන සියයට 44, සියයට 4 ක ඉහළ යාමක් කළ අතර, මුළු ආනයනයන්ගෙන් කොටස වන සියයට 36, පසුගිය වර්ෂය හා සැසැඳීමේ දී සියයට 2 කින් පහළ ගියේය. පොදු රාජ්‍ය මණ්ඩලය සමග වූ ලංකාවේ වෙළෙඳ ශේෂ අතිරික්තය 1967 දී රුපියල් දශලක්ෂ 128 ක් වූ අතර, පසුගිය අවුරුද්දෙහි පැවැති මීට වෙනස් තත්ත්වය වන රුපියල් දශලක්ෂ 54 ක් වූ හිඟය හා සැසැඳේ.

යුරෝපා ආර්ථික සමාජයට කරන ලද ආනයනවල වටිනාකම රුපියල් දශලක්ෂ 140 ක් වූ අතර, පසුගිය වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 11 ක් හෙවත් සියයට 9 කින් වැඩිවිය. යුරෝපීය සමාජයෙන් කරන ලද ආනයනවල වටිනාකම රුපියල් දශලක්ෂ 269 ක් වූ අතර අනිත් අතට, රුපියල් දශලක්ෂ 49 කින් හෙවත් සියයට 22 කින් තියුණු ලෙස ප්‍රාසාරණය විය. පසුගිය වර්ෂය හා සසඳ බලන කල, ආර්ථික සමාජයේ කොටස වූ සියයට 8 ක මුළු අපනයන ප්‍රමාණය නොවෙනස්ව පැවතුනි. එහෙත් එහි කොටස වූ සියයට 15 ක ආනයන ප්‍රමාණය සියයට 3 කින් ඉහළ ගියේය. ආර්ථික සමාජය සමග පැවති වෙළෙඳාම් ශේෂයේ හිඟය, 1966 දී රුපියල් දශලක්ෂ 91 ක් වූ අතර, විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 129 දක්වා, රුපියල් දශලක්ෂ 38 කින් තවදුරටත් පිරිහිණි.

යුරෝපා නිදහස් වෙළෙඳ සංගමයේ රටවලට යවන ලද, රුපියල් දශලක්ෂ 484 ක් වූ අපනයන, පසුගිය වර්ෂයට වඩා, 1967 දී රුපියල් දශලක්ෂ 58 කින් හෙවත් සියයට 14 කින් වැඩි වූ අතර, එම රටවලින් පැමිණි රුපියල් දශලක්ෂ 313 ක් වූ ආනයන ප්‍රමාණය, රුපියල් දශලක්ෂ 69 කින් හෙවත් සියයට 18 කින් පහළ වැටිණ. සියයට 29 ක් වූ සංගමයේ මුළු අපනයන කොටස පසුගිය වර්ෂයට වඩා සියයට 4 ක වැඩිවීමක් පෙන්නුම් කළ අතර, සියයට 18 ක් වූ එහි මුළු ආනයන කොටස, සියයට 1 කින් පහළ වැටිණ. 1966 දී වෙළෙඳ සංගමයේ රටවල් සමග කෙරුණු භාණ්ඩ වෙළඳාමේ, රුපියල් දශලක්ෂ 44 ක් වූ අතිරික්තය, පවත්නා වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 171 දක්වා ඉහළ නැගිණි.

ආ. ඇ. පෙ. ආ. කො. (ඉකැපේ) කලාපයේ රටවලට කරන ලද රුපියල් දශලක්ෂ 399 ක් වූ ආනයන වටිනාකම, 1966 දී පැවති මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 34 කින් හෙවත් සියයට 8 කින් පහළ වැටුණු බව පෙනිණ. කෙසේ නමුත්, මෙම කලාපයෙන් කරන ලද ආනයනවල වටිනාකම තවදුරටත් පහළ වැටී, රුපියල් දශලක්ෂ 736 ක් ව පැවති අතර, පසුගිය වර්ෂයට වඩා එම ප්‍රමාණය රුපියල් දශලක්ෂ 250 කින් අඩු විය. මෙම කලාපයේ මුළු අපනයන සහ ආනයන කොටස වූ පිළිවෙලින් සියයට 24 සහ 42 ක් වූ ප්‍රමාණයන් පසුගිය වර්ෂයේ පැවති මට්ටමට වඩා පිළිවෙලින් සියයට 1 කින් සහ සියයට 7 කින් පහළ වැටිණි.

**මහජන චීන සමූහාණ්ඩුව සමග වෙළෙඳාම**

පසුගිය වර්ෂය හා සසඳ බලන කල, අපනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 153 දක්වා, රුපියල් දශ ලක්ෂ 24 කින් හෙවත් සියයට 14 කින් පහළ වැටුණු අතර, ආනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 185 දක්වා, රුපියල් දශ ලක්ෂ 32 කින්

හෙවත් සියයට 15 කින් පහළ වැටීමත් සමඟම ලංකාව, 1967 දී මහජන චීන සමූහාණ්ඩුවත් සමග කරන ලද වෙළඳමේ මුළු පිරිවැටුම පැහැදිලි ලෙස පහළ වැටිණි.

වෙළෙඳ ශේෂයේ හිඟය රුපියල් දශ ලක්ෂ 32 ක් වූ අතර, 1966 වෙළෙඳ ශේෂයේ හිඟය රුපියල් දශ ලක්ෂ 40 ක් විය.

මහජන චීන සමූහාණ්ඩුවට කරන ලද ප්‍රධාන අපනයන ද්‍රව්‍යවූ රබර් අපනයන වල වටිනාකම 1966 දී මෙහි රුපියල් දශ ලක්ෂ 163·6 ත් 1967 දී රුපියල් දශ ලක්ෂ 137·8 දක්වා පහළ වැටිණි. අපනයන කරන ලද රබර් ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 130·9 ක්වූ අතර, 1966 දී එම ප්‍රමාණය රාත්තල් දශ ලක්ෂ 132·9 ක් විය. 1967 දී අපනයනය කරන ලද පොල්තෙල්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 13·7 ක්වූ අතර, එම ප්‍රමාණය 1966 අපනයන වටිනාකමට වඩා රුපියල් දශ ලක්ෂ 3·9 ක වැඩිවීමක් සටහන් කළේය. 1967 දී තේ අපනයනය කිරීමක් සිදු නොවූ අතර, 1966 දී අපනයනය කරනු ලැබූ තේ ප්‍රමාණයේ වටිනාකම රුපියල් දශ ලක්ෂ 3·6 ක් විය.

ලංකාවට, චීනයෙන් ආනයනය කළ සහල්, ප්‍රධාන ආනයන ද්‍රව්‍යය වශයෙන් දිගටම පැවැත්තේය. රේගු සංඛ්‍යා අනුව, ආනයනය කරන ලද, සහල්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 106·1 ක් වූ අතර, එම ප්‍රමාණය 1966 දී කරන ලද ආනයන ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 11·4 ක් හෙවත් සියයට 10 කින් අඩුවූ ප්‍රමාණයක් විය. චීනය සමගවූ වෙළෙඳ සහ ගෙවීම් සම්මුතිය යටතේ, ලංකාවෙන් අපනයනය කරනු ලබන මෙට්රික් ටොන් 48,000 ශීට් රබර් ප්‍රමාණය වෙනුවට මෙට්‍රික් ටොන් 2,00,000 ක් හාල් ප්‍රමාණයක් ආනයනය කිරීමට 1967 දී ගිවිස ගන්නා ලදී. සියලුම මාගී වලින් කරන ලද සීනි ආනයන ප්‍රමාණයෙන් සියයට 37·4 ක් හෙවත් රුපියල් දශ ලක්ෂ 27·5 වටිනා සීනි ප්‍රමාණයක් මහජන චීන සමූහාණ්ඩුවෙන් ආනයනය කරන ලදී. මෑත අවුරුදු වලදී මහජන චීන සමූහාණ්ඩුවෙන් මිලදී කරන ලද ආනයන අතර, ප්‍රධාන ආනයන භාණ්ඩයක් වූ රෙදි පිළිවල වටිනාකම 1967 දී රුපියල් දශ ලක්ෂ 22·3 කින් රුපියල් දශ ලක්ෂ 22·6 දක්වා පහළ වැටිණි. ආනයනය කරන ලද වෙනත් ද්‍රව්‍ය අතර රුපියල් දශ ලක්ෂ 6·9 වටිනා තිරිඟු පිටි ද, රුපියල් දශ ලක්ෂ 6·6 වටිනා වියලි මිරිස් ද, රුපියල් දශ ලක්ෂ 3·9 වටිනා මුංඇට ද විය.

**සෝ. ස. ස.සං. සහ නැගෙනහිර යුරෝපය සමග වෙළෙඳම.**

1967 දී සෝ. ස. සමු. සංගමය සහ නැගෙනහිර යුරෝපය සමග ලංකාවේ වෙළෙඳ පිරිවැටුමෙහි, තියුණු පහළ වැටීමක් දිස් විය පසුගිය වර්ෂය හා සසඳ බලන කල, මෙම කලාපයෙන් සහ මෙම කලාපය වෙත පිළිවෙලින්, දශ ලක්ෂ 104·0 ක් වටිනා අපනයන ද, රුපි. දශ ලක්ෂ 164·1 ක් වටිනා ආනයනද කරන ලද අතර, පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ.50·3 කින් හෙවත් සියයට 33 කින් සහ රුපියල් දශ ලක්ෂ 38·7 කින් හෙවත් සියයට 19 කින් වටිනාකම් පහළ වැටිණි. 1966 දී මෙම කලාපය සමග පැවති රුපියල් දශලක්ෂ 48·5 ක්වූ වෙළෙඳ ශේෂයේ හිඟය වර්ෂය තුළදී තව තවදුරටත් පිරිහී, 1967 දී හිඟය රුපියල් දශ ලක්ෂ 60·1 දක්වා වැඩිවිය. මෙම කලාපය සමග ලංකාව පසුගිය වර්ෂ දෙක තුළ දී කරන ලද වෙළෙඳමේ වටිනාකම, මුළු විදේශීය වෙළෙඳමෙන් සියයට 10 ක් වූ අතර, 1967 දී සියයට 2 කින් අඩුවී සියයට 8 දක්වා පහළ වැටිණි.

ඉකුත් වර්ෂවලදී මෙන්ම, ලංකාවෙන් මෙම කලාපයට කරන ලද මුළු අපනයනයන්ගේ, රුපියල් දශ ලක්ෂ 57·1 හෙවත් සියයට 55 ක් වටිනා ද්‍රව්‍ය මිළදී ගැණීමෙන්, සෝ: ස: ස. සංගමය මෙම කලාපයේ ප්‍රධාන ගැනුම්කරුවා විය. අපනයනය කළ සියළුම ප්‍රධාන ද්‍රව්‍ය අඩුවීම හේතු කොට ගෙන, සෝ. ස. සමු. සංගමයට කළ

අපනයනවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 25·0 කින් හෙවත් සියයට 30 කින් අඩු විය. වර්ෂයේ ප්‍රධාන අපනයන ද්‍රව්‍යවූ රබර්වල වටිනාකම 1967 දී රුපියල් දශ ලක්ෂ 7·3 කින් හෙවත් සියයට 23 කින්, රුපියල් දශ ලක්ෂ 24·0 දක්වා අඩුවූ අතර, රුපියල් දශ ලක්ෂ 14.2 ක්වූ අපනයනය කළ තේවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 7·4 කින් හෙවත් සියයට 34 කින් පහළ වැටුනි. 1966 දී තියුණු ලෙස ප්‍රාසාරණයවූ පොල් තෙල් අපනයනය, විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළදී, රුපියල් දශ ලක්ෂ 7·8 ක හෙවත්, සියයට 35 ක අඩුවීමක් සටහන් කළේය. කොප්පරා අපනයන ද, පසුගිය වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 1·7 කින් හෙවත් සියයට ·36 කින් අඩුවිය. පෝලන්තයට කරන ලද අපනයනවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 12·5 ක් හෙවත්, කලාපයට කරන ලද මුළු අපනයන වලින් සියයට 12 ක්වූ අතර, 1966 පැවති අපනයන මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 12·3 කින් හෙවත් සියයට 50 කින් තියුණු අන්දමින් පහළ වැටිණි. 1966 පැවති මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 12·9 ක් හෙවත් සියයට 65 ක අඩුවීමක් සටහන් වූ රුපියල් දශ ලක්ෂ 6·8 ක්වූ රබර් අපනයනය, ඉකුත් වර්ෂ වලදී මෙන්ම ප්‍රධාන අපනයන ද්‍රව්‍ය බවට පත්විය. රුපියල් දශ ලක්ෂ 1·3 ක්වූ අපනයනය කරන ලද පොල් තෙල්වල වටිනාකමද, රාපියල් දශ ලක්ෂ 2·3 කින් හෙවත් සියයට 64 කින් පහළ වැටිණි. රුපියල් දශ ලක්ෂ 1·0 ක්වූ 1966 දී අපනයන කරන ලද තේ වල වටිනාකම, විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 3·1 දක්වා ඉහළ නැංගේය. රන් පවුම් 3,00,000 වටිනා තේ ටොන් 1,000 ක් සම වටිනාකමින් යුත් රෙදිපිළි වලට හුවමාරු කිරීම සඳහා ඇති කරගන්නා ලද හුවමාරු සම්මුතිය, පෝලන්තයට අපනයනය කරන ලද තේ වල් වටිනාකම වැඩිවීමට බොහෝදුරට හේතුවිය.

1966 දී රුමේනියාවට යවන ලද රුපියල් දශ ලක්ෂ 18·0 ක්වූ අපනයන ප්‍රමාණය, 1967 දී රුපියල් දශ ලක්ෂ 18·7 දක්වා රුපියල් දශ ලක්ෂ 0·7 කින් සුළු වශයෙන් හෙවත් සියයට 4 කින් ඉහළ ගිය අතර, මෙම ප්‍රමාණය, කලාපයට කරන ලද අපනයන වලින් සියයට 18 ක් විය. රුපියල් දශ ලක්ෂ 16·4 දක්වා රබර් අපනයනයන් රුපියල් දශ ලක්ෂ 1·7 කින් හෙවත් සියයට 12 කින් වැඩිවීම, අපනයන වටිනාකමේ මෙම වැඩිවීමට බොහෝදුරට හේතු විය, එයින් ඇතිවුණු ප්‍රතිවිපාක, අපනයනය කරන ලද පොල් තෙල් සහ කොකෝවා වටිනාකම පහළ වැටීමෙන් සුළු වශයෙන් මගහැරිණි. 1967 දී ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවට කරන ලද අපනයන වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 7·9 ක් දක්වා, රුපියල් දශ ලක්ෂ 11·2 කින් හෙවත් සියයට 59 කින් තියුණු ලෙස පහළ වැටුණු අතර, මෙම ප්‍රමාණය කලාපයට කරන ලද මුළු අපනයන ප්‍රමාණයෙන් සියයට 8 ක් විය. වර්ෂය තුළදී ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවට අපනයනය කරන ලද ලංකාවේ අපනයන වලින් සියයට 99 ක් පොල් තෙල් සහ කපාපු පොල් විය. රුපියල් දශ ලක්ෂ 6·9 ක්වූ, අපනයනය කරන ලද පොල්තෙල්වල වටිනාකම 1966 පැවති අපනයන මට්ටමට වඩා රුපියල් දශ ලක්ෂ 5·1 කින් හෙවත් සියයට 43 කින් පහළ වැටුණු අතර, අපනයනය කරන ලද කපාපු පොල්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 2·1 කින් හෙවත් සියයට 70 කින් පහළ වැටිනි. රුපියල් දශ ලක්ෂ 3·2 ක්වූ යුගෝස්ලෝවියාවට කරන ලද අපනයන රුපියල් දශ ලක්ෂ 0·2 කින් හෙවත් සියයට 6 කින් වැඩිවූ අතර, 1967 දී චෙකෝස්ලෝවියාවට සහ හංගේරියාවට කරන ලද අපනයන වල වටිනාකමේ එකතුව, පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 2·5 ක් සහ රුපියල් දශ ලක්ෂ 1·0 වීමෙන්, පිළිවෙළින් රුපියල් දශ ලක්ෂ 2·4 ක හෙවත් සියයට 49 ක සහ රුපියල් දශ ලක්ෂ 0·3 ක හෙවත් සියයට 23 ක පහළ වැටීමක් සටහන් විය. රුපියල් දශ ලක්ෂ 1·1 ක්වූ, බල්ගේරියාවට යවන ලද අපනයනවල වටිනාකම ඉකුත් වර්ෂය හා සලකන කල නොවෙනස්ව පැවතිණි.

සෝ. ස. ස. සංගමය තවදුරටත් කලාපයේ ප්‍රධානතම ආනයන සැපයුම් කරුවා විය. රුපියල් දශ ලක්ෂ 110·3 ක් වටිනා සෝ. ස ස. සංගමයෙන් ගෙන්වන ලද ආනයන, ප්‍රමාණය පසුගිය වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 5·7 ක හෙවත් සියයට 5 ක පහළ වැටීමක් සටහන් කළේය. මෙම ආනයන, කලාපයෙන් කරන ලද මුළු ආනයන ප්‍රමාණයෙන් සියයට 67 ක් විය. මෑත අවුරුදු වලදී සිදුවූ පරිදි සෝ. ස ස. සංගමයෙන් කරන ලද මුළු ආනයන වලින් සියයට 44 ක්වූ ඛනිජ තෙල් නිෂ්පාදන, ප්‍රධාන ආනයන ද්‍රව්‍ය වූ අතර, 1967 දී එහි වටිනාකම රුපියල් දශ ලක්ෂ 25·6 කින් හෙවත් සියයට 35 කින් රුපියල් දශ ලක්ෂ 47·2 දක්වා පහළ බැස්සේය. සමස්ත වශයෙන් කලාපයෙන් අපනයනය කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදනවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 56·2 ක් හෙවත් සියළුම මාගී වලින් ගෙන්වන ලද මෙම නිෂ්පාදන ද්‍රව්‍ය ආනයනවල එකතුවෙන් සියයට 50 ක් විය. සෝ. ස. ස. සංගමයෙන්, 1967 දී ආනයනය කරන ලද රුපියල් දශ ලක්ෂ 37·2 ක්වූ සීනිවල වටිනාකම පසුගිය වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 27·9 කින් තියුණු ලෙස වැඩිවිය. සෝ. ස. ස. සංගමයෙන් ආනයනය කරන ලද වෙනත් සැලකියයුතු භාණ්ඩ වූයේ රුපියල් දශ ලක්ෂ 4·9 වටිනා තේ පෙට්ටි, රුපියල් දශ ලක්ෂ 6·4 වටිනා යකඩ සහ වානේ නිෂ්පාදන, රුපියල් දශ ලක්ෂ 4·1 ක් වටිනා පෝර වර්ග සහ රුපියල් දශ ලක්ෂ 3·1 වටිනා සිමෙන්තිය.

රුපියල් දශ ලක්ෂ 10·1 ක්, හෙවත් කලාපයෙන් කරන ලද මුළු ආනයන වලින් සියයට 6 ක්වූ පෝලන්තයෙන් කරන ලද ආනයන ප්‍රමාණය ඉකුත් වර්ෂය හා සසඳ බලන කල, වැඩියෙන් එනම්, රුපියල් දශ ලක්ෂ 21·9 කින් හෙවත් සියයට 68 කින් පහළ වැටිණි.

පෝලන්තයෙන් ගෙන්වන ලද සීනි, ප්‍රධාන ආනයනය වූ අතර, එම රටෙන් කරන ලද මුළු ආනයන වලින් සියයට 36 ක් පමණ විය. බල්ගේරියාවෙන් ගෙන්වූ ප්‍රධාන ආනයන භාණ්ඩ සීනි විය. බල්ගේරියාවෙන් ගෙන්වන ලද මුළු ආනයන වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 3·8 ක් විය. කලාපයෙන් ආනයන කරන ලද සීනි වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 43·3 ක්වූ අතර, එම ප්‍රමාණය සියළුම මාගී වලින් ආනයනය කරන ලද මුළු සීනි ප්‍රමාණයෙන් සියයට 60 ක් විය. චෙකෝස්ලෝ-වේකියාවෙන් රුපියල් දශ ලක්ෂ 9.4 වටිනා ආනයන ගෙන්වූ අතර, මෙය රුපියල් දශ ලක්ෂ 6·2 ක හෙවත් සියයට 40 ක පහළ වැටීමක් විය. උකුකළ කිරි හැර චෙකොස්ලෝවේකියාවෙන් ගෙන්වන ලද ආනයනවල පහළ බැසීමක් සටහන් විය. කෙසේ නමුත් 1967 දී ආනයනය කරන ලද උකුකළ කිරිවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 1·2 දක්වා මෙය රුපියල් දශ ලක්ෂ 0·7 ක වැඩිවීමක් සටහන්විය. රුමේනියා-වෙන් කරන ලද ආනයන, 1966 දී රුපියල් දශ ලක්ෂ 15·6 කින් වැඩිවූ අතර, 1967 දී රුපියල් දශ ලක්ෂ 14·1 දක්වා රුපියල් දශ ලක්ෂ 14·2 කින් හෙවත් සියයට 50 කින් තියුණු ලෙස පහළ වැටුණි. මෙම පහළ වැටීමට ප්‍රධාන හේතුව වූයේ, සිමෙන්ති ආනයනය රුපියල් දශ ලක්ෂ 5·0 ක හෙවත් සියයට 78 ක ප්‍රමාණයකින් අඩුවීමය. මුළු කලාපයෙන්ම ආනයන කරන ලද සිමෙන්ති වල වටිනාකම, රුපියල් දශ ලක්ෂ 4·5 හෙවත් සෑම මාගීයකින්ම ආනයන කරන ලද මෙම භාණ්ඩ-යෙන් සියයට 82 ක් විය. රුපියල් දශ ලක්ෂ 5·2 ක් වූ ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජන රජයෙන් කරන ලද අපනයන වටිනාකම, පසුගිය වර්ෂයට වඩා කිසිදු වෙනසක් නොපෙන්විය. 1967 දී යුගෝස්ලොවියාවෙන් කරන ලද ආනයනවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 7·8 දක්වා රුපියල් දශ ලක්ෂ 5·2 කින් තියුණු ලෙස වැඩිවීමට, ප්‍රධාන වශයෙන් හේතුවූයේ, විදුලි නොවන යන්ත්‍ර, ආනයනය වැඩිවීමය. එම භාණ්ඩ-වල වටිනාකම 1967 දී රුපියල් දශ ලක්ෂ 4·0 කින් ප්‍රසාරණය විය. රුපියල් දශ ලක්ෂ 3·4 ක්වූ හංගේරියාවෙන් කරන ලද ආනයන වටිනාකම ඉකුත් වර්ෂයට වඩා රුපියල් දශ ලක්ෂ 2·1 ක වැඩිවීමක් සටහන් කළේය.

**ද්විපාර්ශ්වීය නිෂ්කාශන ගිණුම්**

II (ඒ) 12 සංඛ්‍යා සටහන, මහජන චීන සමූහාණ්ඩුව, සෝ. ස. ස. සං. සහ නැගෙනහිර යුරෝපයේ සහ මැද පෙරදිග සමහර රටවල් සමග ලංකාව ඇතිකරගත්, ගෙවීම් ගිවිසුම් අනුව, පවත්වාගෙන යනු ලබන ද්විපාර්ශ්වීය නිෂ්කාශන ගිණුම් වල ඒ ඒ කාර්තු අවසානයේ වූ ශුද්ධ සමාංතර තත්ත්වය දක්වයි.

## සංඛ්‍යා සටහන II (එ) 12
## ද්විපාර්ශ්වීය නිෂ්කාශන ගිණුම්
## 1963 - 1967 නිෂ්කාශන ගිණුම් වල ශුද්ධ සමාහාරය කාර්තු වශයෙන්

රුපියල් දශ ලක්ෂ

| අවසානයට ගිණුම් තතු (ශුද්ධ) | චීනය සෝ. ස ස. සං සහ වෙනත් නැගෙනහිර යුරෝපීය රටවල්* | | මැද පෙරදිග රටවල් ** | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | බැර | හර | බැර | හර |
| 1963 මාර්තු .. .. | — | 0·2 | — | 2·7 | — | 2·9 |
| ජූනි .. .. | 12·2 | — | 0·6 | — | 12·8 | — |
| සැප්තැම්බර් .. .. | — | 6·5 | 2·1 | — | — | 4·4 |
| දෙසැම්බර් .. .. | 31·1 | — | 3·1 | — | 34·2 | — |
| 1964 මාර්තු .. .. | 52·3 | — | — | 0·3 | 52·0 | — |
| ජූනි .. .. | 58·4 | — | 2·4 | — | 60·8 | — |
| සැප්තැම්බර් .. .. | 59·1 | — | — | 1·9 | 57·2 | — |
| දෙසැම්බර් .. .. | 57·0 | — | — | 5 5 | 51·5 | — |
| 1965 මාර්තු .. .. | 57·9 | — | — | 5·0 | 52·9 | — |
| ජූනි .. .. | 12·1 | — | — | 8·7 | 3·4 | — |
| සැප්තැම්බර් .. .. | — | 46·6 | — | 6·6 | — | 53·2 |
| දෙසැම්බර් .. .. | — | 25·3 | ... | 5·8 | — | 31·1 |
| 1966 මාර්තු .. .. | — | 49·3 | — | 13·2 | — | 62·5 |
| ජූනි .. .. | — | 6·3 | — | 3·3 | — | 9·6 |
| සැප්තැම්බර් .. .. | — | 27·7 | — | 1·8 | — | 29·5 |
| දෙසැම්බර් .. .. | 8·1 | — | — | 3·7 | 4·4 | — |
| 1967 මාර්තු .. .. | 3·3 | — | — | 6·5 | — | 3·2 |
| ජූනි .. .. | — | 2·1 | — | 7·9 | — | 10·0 |
| සැප්තැම්බර් .. .. | 42·7 | — | — | 10·0 | 32·7 | — |
| දෙසැම්බර් .. .. | 104·3 | — | — | 8 8 | 95·5 | — |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

* බල්ගේරියාව, චෙකෝස්ලොවැකියාව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව, (නැගෙනහිර ජර්මනිය), හංගේරියාව, පෝලන්තව, රුමේනියාව, යුගෝස්ලොවියාව, (1965 මාර්තු සිට) කොරියාව, ප්‍රජාතන්ත්‍රවාදී මහජන සමූහාණ්ඩුව (1965 මාර්තු සිට).

** එක්සත් අරාබි සමූහාණ්ඩුව, අයිරානය (1964 ඔක්තෝබර් දක්වා) සහ සිරියාව.

සටහන: බැර = ලංකාවෙන් අයවිය යුතු.
හර = ලංකාවට අයවිය යුතු.

### වෙළෙඳ ප්‍රතිපත්තියේ ඇති වූ වර්ධනයන්

### අපනයන පාලනය

(අ) 1967 මාර්තු පළමුවැනි ද සිට වෙන්දේසියෙන් පිට අලෙවි කල පුද්ගලික තේ (සංයෝග නොකරන ලද අමිශ්‍ර තේ) ඇ. එ. ජනපදයට සහ කැනඩාවට යැවීම සඳහා නැව්ගත කිරීමට, සමසක කාලඡේදයකට අවසර දෙන ලදී. පසුව, කාලපරිච්ඡේදය 1967 දෙසැම්බර් මස 31 වැනි ද දක්වා දීර්ඝ කරන ලදී.

(ආ) 1967 මැයි 26 වැනි දින සිට ලංකාවෙන් සිප්පිකටු අපනයනය කිරීම සමුපකාර සංගම් වලට පමණක් සීමා කරන ලදී. මින් මතු පෞද්ගලික අපනයනිකයින්ට බලපත්‍ර නිකුත් නොකරනු ඇත.

(ඇ) 1967 අගෝස්තු 29 වැනි දින සිට කිරි ආහාර ද්‍රව්‍ය ලංකාවෙන් ගෙන යාම පිළිබඳව සීමා කිරීම් ඇති කරන ලදී. මගියෙකු සමග යන, මාස 15 කට අඩු ළදරුවන් සඳහා, විවෘත කරන ලද ළදරු කිරි ආහාර රාත්තලක ටින් 1 ක් පමණක් ගෙන යාමට අවසර ඇත.

**ආනයන පාලනය**

1967 දී ආනයන පාලන බලපත්‍ර පිළිවෙතෙහි කිසිදු වෙනසක් නොකෙරුණු අතර, පෞද්ගලික අංශයේ සියලුම ආනයන, පෞද්ගලික ආනයන බලපත්‍ර ක්‍රමය තුළ දිගටම පවත්වාගෙන යන ලදී.

**විදේශීය විනිමය අයවැය ලේඛනය**

සියලුම ආනයන ද්‍රව්‍ය සඳහා, සම්පත් වෙන් කිරීමේ උපකරණයක් වශයෙන්, විදේශීය විනිමය අය වැය ලේඛනය 1967 දී දිගටම ක්‍රියාත්මක විය. 1967 සඳහා විදේශීය විනිමය අය වැය ලේඛනය පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය වූයේ අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය හැර, අර්තාපල් වැනි දේශීය නිෂ්පාදනය වැඩි වේ යයි බලාපොරොත්තු විය හැකි, පාරිභෝජන භාණ්ඩ ආනයනය සඳහා, වෙන් කරනු ලබන මුදල් ප්‍රමාණය අඩු කොට, එසේ ආරක්ෂා කරගත් විදේශීය විනිමය, ආර්ථික සංවර්ධනයට අවශ්‍ය වූ අන්තර් භාණ්ඩ සහ ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය සඳහා යොමු කරවීමය. 1967 වර්ෂය සඳහා පිළියෙල කරන ලද විදේශීය විනිමය අය වැය ලේඛනය රුපියල් දශ ලක්ෂ 2·231[1] ක් වටිනා ආනයන සඳහා මුදල් වෙන් කරන ලදී. මුදල් සපයා ගනු ලැබූ මාර්ග වූයේ, 1967 අපනයන ලැබීම්, 1967 බලාපොරොත්තු වූ භාණ්ඩ ආධාර ලැබීම්, සහ 1965 සහ 1966 වර්ෂ වලදී ගිවිස ගන්නා ලද ආධාර වල ඉතිරියෙනි. ආනයන සඳහා නිකුත් කරන ලද බලපත්‍ර වල මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 2,055 ක් වූ අතර, එය මුල් ඇස්තමේන්තු වල ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 176 කින් පමණ අඩුවූ ප්‍රමාණයක් විය. මෙය අය වැය ලේඛනයේ මුදල් කිරීම සඳහා ලැබේයයි බලාපොරොත්තු වූ සම්පත් නොලැබී යාම නිසාය. 1966 නිකුත් කරන ලද බලපත්‍ර, 1967 සඳහා වූ මුල් ආනයන සැලැස්මවල් සහ 1967 නිකුත් කරන ලද ආනයන බලපත්‍ර වටිනාකම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු පහත සඳහන් සංඛ්‍යා සටහනෙන් දැක්වේ.

සංඛ්‍යා සටහන II (එ) 13

**1967 ආනයන සැලැස්ම සහ 1966* සඳහා වූ තුලනාත්මක සංඛ්‍යා තොරතුරු**

රුපියල් දශ ලක්ෂ

| | 1966 නිකුත් කළ බලපත්‍ර | 1967 තාවකාලික | |
|---|---|---|---|
| | | මූලික | නිකුත් කළ බලපත්‍ර |
| ආහාර කොමසාරිස්වරයාගේ ආනයන .. | 504 | 597 | 581 |
| අනෙකුත් ආහාර ද්‍රව්‍ය .. | 312 | 240 | 253 |
| රෙදිපිළි .. | 124 | 65 | 65 |
| පොහොර .. | 98 | 106 | 101 |
| ඛනිජ තෙල් නිෂ්පාදන .. | 132† | 130† | 152‡ |
| ඖෂධ වර්ග .. | 25 | 17 | 15 |
| සිමෙන්ති .. | 18 | 15 | 17 |
| රජයේ දෙපාර්තමේන්තු .. | 166 | 259 | 157 |
| කාර්මික නොවන සංයුක්ත මණ්ඩල .. | 86 | 101 | 68 |
| පෞද්ගලික අංශයේ කර්මාන්ත සහ ධීවර .. | 277 | 305 | 305 |
| ගෘහ කර්මාන්ත සහ සමූපකාර .. | – | 12 | |
| කර්මාන්ත සංයුක්ත මණ්ඩල .. | 59 | 99 | 86 |
| වෙනත් වෙළෙඳ පංගු 'ශීෂී' .. | 241 | 203 | 185 |
| සෞඛ්‍ය පරිහරණය සඳහා වූ ද්‍රව්‍ය .. | 68 | 83 | 70 |
| එකතුව .. | 2,110 | 2,231 | 2,055 |

මූලය: ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

* තාවකාලික.

† නාවික සහ ගුවන් ඉන්ධන ආනයන සඳහා වූ 'විනිමය නොමැති පදනම' අනුව රුපියල් දශ ලක්ෂ 35 ක් ඇතුළත්ව.

‡ නාවික සහ ගුවන් ඉන්ධන ආනයන සඳහා වූ 'විනිමය නොමැති පදනම' අනුව රුපියල් දශ ලක්ෂ 48 ක් ඇතුළත්ව.

1. ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශ විසින් නිකුත් කරන ලද ''විදේශීය විනිමය අය-වැය ලේඛනය'' 1967 ජූලි.

"වෙනත් ආහාර ද්‍රව්‍ය" සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණයෙන්, ප්‍රධාන අඩු කිරීම් කරන ලද්දේ, වියළි මිරිස්, පිටි කළ කිරි, බොම්බයි ළූනු සහ අර්තාපල් ද්‍රව්‍ය වෙනුවෙනි. 1967 මැයි මස අවසානයේ සිට අර්තාපල් ආනයනය සම්පූර්ණයෙන්ම තහනම් කරන ලදී. වියළි මිරිස්, බොම්බයි ළූණු සහ අර්තාපල් සඳහා මුදල් වෙන් කිරීම අඩු කිරීමෙන් 1967 වර්ෂය තුළදී දේශීය නිෂ්පාදනය දිරිගැන්වීමට අපේක්ෂා කෙරුණි. රෙදි පිළි සඳහා මුදල් වෙන් කිරීම, 1966 රුපියල් දශ ලක්ෂ 124 සිට 1967 රුපියල් දශ ලක්ෂ 65 දක්වා අඩුකිරීම කරන ලද්දේ, 1966 අවසානයේ ගොඩබෑන ලද සහ නැව් වල තිබූ විශාල තොග (රෙදි යාර දශ ලක්ෂ 48) සහ දේශීය නිෂ්පාදනයෙන් වැඩි වී ඇති සැපයුම ද සලකා බැලීමෙන් පසුවය. ද්‍රව්‍ය බොහොමයක් ඇතුලත් වන, වෙනත් වෙළඳ පංගු ශීර්ෂ කොටසේ දේශීය නිෂ්පාදනය වැඩිවීමේ හැකියාව සහ "අත්‍යවශ්‍ය නොවන" උපමානය හෙවත් ප්‍රමුඛත්වය අඩු පදනම යටතේ, ප්‍රධාන වශයෙන් පාරිභෝජන ද්‍රව්‍ය අඩු කරන ලදී.

පළමුවන, දෙවන සහ තෙවන විදේශීය භාණ්ඩ ආධාර සැලැස්මවල් යටතේ, 1967 වර්ෂයේ දී කරන ලද ආනයනයන් හි වටිනාකම, පහත දැක්වෙන සංඛ්‍යා සටහනෙන් දැක්වේ.

### සංඛ්‍යා සටහන II (ඒ) 14

### 1967 දී ලැබුණු භාණ්ඩ ආධාර සැලැස්මවල්

රුපියල් දශ ලක්ෂ

| රටවල් | පාරිභෝජන භාණ්ඩ | | | අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ | | | එකතුව | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ආධාර ක්‍රමය යටතේ | | | ආධාර ක්‍රමය යටතේ | | | ආධාර ක්‍රමය යටතේ | | | |
| | I | II | III | I | II | III | I | II | III | |
| ඕස්ට්‍රේලියාව .. | – | – | 3·48 | – | – | – | – | – | 3·48 | 3·48 |
| ජර්මන් (ෆෙඩරල් සමූහාණ්ඩුව) | – | 2·60 | – | 8·68 | 17·03 | – | 8·68 | 19·63 | – | 28·31 |
| ඉන්දියාව .. | 5·40 | – | – | – | – | – | 5·40 | – | – | 5·40 |
| ජපානය .. | 0·79 | 14·27 | – | 1·13 | 3·76 | – | 1·92 | 18·03 | – | 19·95 |
| ප්‍රංශය .. | – | 4·09 | – | – | 17·64 | – | – | 21·73 | – | 21·73 |
| එක්සත් රාජධානිය .. | – | – | – | 17·59 | 31·06 | 1·91 | 17·59 | 31·06 | 1·91 | 50·56 |
| ඇමෙරිකා එක්සත් ජනපදය .. | 13·88 | – | – | 20·77 | 20·49 | – | 34·65 | 20·49 | – | 55·14 |
| කැනඩාව .. | – | 8·99 | 11·00 | – | 3·13 | – | – | 12·12 | 11·00 | 23·12 |
| එකතුව .. | 20·07 | 29·95 | 14·48 | 48·17 | 93·11 | 1·91 | 68·24 | 123·06 | 16·39 | 207·69 |

මූලය: ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

භාණ්ඩ ආධාර සැලැස්ම යටතේ 1967 දී ලැබූ ආනයන වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 207·68 ක් වූ අතර, මෙයින් රුපියල් දශ ලක්ෂ 68·24 ක්, ප්‍රථම සැලැස්ම යටතේ ද, රුපියල් දශ ලක්ෂ 123·06 ක් දෙවන සැලැස්ම යටතේ ද, රුපියල් දශ ලක්ෂ 16·39 ක්. තෙවන සැලැස්ම යටතේ ද ලැබුණි. පාරිභෝගික භාණ්ඩ කාණ්ඩය යටතේ ලැබුණු මුළු ආධාර වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 64·50 හෙවත් සියයට 31 ක් වූ අතර, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ කාණ්ඩවලට ලැබුණු ආධාර වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 143·19 හෙවත්, 1967 දී සියලුම මාර්ගවලින් ලැබුණු ආධාර වල මුළු වටිනාකමින් සියයට 69 ක් විය.

පහත ඇති සංඛ්‍යා සටහන, 1967 ලැබුණු ආධාර භාණ්ඩ අනුව වර්ග කොට දක්වයි. පෝර වර්ග සහ කාර්මික අමුද්‍රව්‍යවල සහ යන්ත්‍ර සූත්‍ර වල කොටස පිළිවෙලින්, සියයට 30·0 සහ සියයට 29·2 ක් විය. මුළු ප්‍රමාණයෙන් සියයට 31 ක් වූ පාරිභෝජන භාණ්ඩ වශයෙන් ලැබුණු ආධාර කොටස තුල, තිරිඟු පිටි, රෙදි පිළි සහ ටයර් සහ ටියුබ් වල කොටස් පිළිවෙලින් සියයට 43·3, සියයට 23·9 සහ සියයට 22·2 විය.

## 1967 දී ආධාර පැමිණීම - භාණ්ඩ වශයෙන්

| භාණ්ඩ | | වටිනාකම රු. දශ ලක්ෂ | ප්‍රතිශත කොටස |
|---|---|---|---|
| **අන්තර් හා ආයෝජන භාණ්ඩ** | | | |
| පොර වර්ග | .. | 42·96 | 30·0 |
| කාර්මික අමු ද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ | .. | 41·75 | 29·2 |
| ට්‍රැක්ටර් හා අමතර කොටස් | .. | 15·53 | 10·8 |
| අනෙකුත් යන්ත්‍රෝපකරන හා අමතර කොටස් | .. | 10·18 | 7·1 |
| වෙළෙඳ හා අනෙකුත් වාහන | .. | 7·71 | 5·4 |
| මෝටර් රථ අමතර කොටස් | .. | 6·98 | 4·9 |
| රජයේ හා සංස්ථාවල අනෙකුත් ආනයන | .. | 5·86 | 4·1 |
| ගොඩනැගිලි උපකරණ | .. | 5·72 | 4·0 |
| ඉංජිනේරු භාණ්ඩ | .. | 4·47 | 3·1 |
| කඩදාසි | .. | 0·94 | 0·7 |
| නාවික යාත්‍රා | .. | 0·61 | 0·4 |
| මූලික ලෝහ | .. | 0·48 | 0·3 |
| එකතුව | .. | 143·19 | 100·0 |
| **පාරිභෝගික භාණ්ඩ** | | | |
| කිරිගු පිටි | .. | 27·96 | 43·3 |
| රෙදි පිළි | .. | 15·42 | 23·9 |
| ටයර් සහ ටියුබ් | .. | 14·33 | 22·2 |
| කරවල | .. | 4·43 | 6·9 |
| ඉරිඟු | .. | 1·40 | 2·2 |
| බෙහෙත් වර්ග | .. | 0·95 | 1·5 |
| එකතුව | | 64·50 | 100·0 |
| මුළු එකතුව | | 207·69 | — |

මූලය: ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

### අපනයන පෙළඹවීමේ ක්‍රමය

වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ කොමසාරිස් වරයාගේ පරිපාලනය යටතේ, 1966.12.1 සිට ක්‍රියාත්මක වූ අපනයන පෙළඹවීමේ ක්‍රමය 1967 දී ද ක්‍රියාත්මක විය. ඇන්ටිමොනියල් ඊයම්, බැටරි. බතික් රෙදි පිළි, විස්කෝතු, අසුරන ලද පළතුරු, කොකෝ, මත් ද්‍රව්‍ය, රස කැවිලි, කපු ඇට, පුන්නක්කු, ග්ලිසරින් (ශුද්ධ නොකළ), එළහම්, (ක්‍රෝම් පදම් කළ) විදුලි ලාම්පු හෝල්ඩර්, කැන්වස් සපත්තු (රබර්), කමිස සහ හම් සපත්තු 1967 දී මෙම ක්‍රමය යටතේ අපනයනය කළ කාර්මික භාණ්ඩයන්ය. ඉහත කී ද්‍රව්‍යයන් අපනයනයෙන් ලබාගත හැකිවූ මුළු විදේශීය විනිමය ප්‍රමාණය රුපියල් 3,093,344 කි. ඉදල්, මයිකා, දුම්කොළ, හා ලී කැටයම් ද 1967 දී මෙම ක්‍රමය යටතේ අපනයනය කරන ලද කාර්මික භාණ්ඩයන්ය. මෙම භාණ්ඩ වලින් උපයා ගන්නාලද විදේශීය විනිමය ප්‍රමාණය රුපියල් 20,016,843 කි. කාර්මික හා කාර්මික නොවන භාණ්ඩ අනුව, වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ කොමසාරිස් තුමා විසින් නිකුත් කරන ලද බෝනස් වවුචර්වල, විස්තර පහත දැක්වෙන සංඛ්‍යා සටහනෙන් පෙන්වා ඇත.

## සංඛ්‍යා සටහන II (එ) 15

### අපනයන පෙලඹවීමේ ක්‍රමය යටතේ නිකුත් කළ බෝනස් වවුචර් වල විස්තර

රුපියල් දශ ලක්ෂ

| | උපයා ගත් මුළු විදේශිය විනිමය ප්‍රමාණය | | නැ. වි. ස. වටිනාකම | | දෙන ලද බෝනස් වවුචර්වල වටිනාකම | |
|---|---|---|---|---|---|---|
| | 1966 රු. ශත | 1967 රු. ශත | 1966 රු. ශත | 1967 රු. ශත | 1966 රුපියල් | 1967 රුපියල් |
| **1. කාර්මික භාණ්ඩ** | | | | | | |
| ඇන්ටිමොනියල් ටියම් .. | 71,746·66 | 191,191·77 | 67,689·75 | 176,339·34 | 13,528 | 36,267 |
| බැටරි .. | -- | 157,715·41 | -- | 157,715·41 | -- | 31,543 |
| බනික් රෙදිපිළි .. | 4,805·31 | 11,064·00 | 4,805·31 | 10,876·66 | 961 | 2,175 |
| විස්කෝතු .. | 41,667·00 | – | 26,668·00 | – | 5,333 | – |
| අසුරන ලද පළතුරු .. | 1,391·89 | 63,051·48 | 1,264·16 | 51,209·90 | 252 | 10,239 |
| කොකෝ මත් ද්‍රව්‍ය .. | 67,240·30 | – | 60,881·93 | – | 12,176 | – |
| රසකැවිලි .. | 1,680·00 | 11,129·00 | 1,283·03 | 8,520·68 | 256 | 1,702 |
| ඉවත් කල කපුඇට (කපුඇට) | 38,627·96 | 10,580·07 | 22,685·00 | 5,852·89 | 4,377 | 1,170 |
| ග්ලිසරින් (ශුද්ධ නොකළ) .. | – | 2058,069·51 | – | 1832,850·97 | – | 126,569 |
| එළු හම් (ක්‍රෝම්පදම් කළ) .. | 169,977·34 | 459,668·29 | 162,669·92 | 436,841·96 | 32,533 | 88,163 |
| විදුලි ලාම්පු–හෝල්ඩර් .. | – | 4,853·69 | – | 4,187·95 | – | 836 |
| රබර් කැන්වස්–සපත්තු .. | 25,232·41 | 77,899·21 | 23,573·27 | 67,788·33 | 4,754 | 13,556 |
| කමිස .. | 897,534·67 | – | 897,534·67 | – | 179,508 | – |
| හම් සපත්තු .. | – | 48,121·30 | – | 48,121·30 | – | 9·624 |
| එකතුව .. | 1319,903·54 | 3093,343·75 | 1269,055·04 | 2800,305·39 | 253,636 | 321,844 |
| **2. කාර්මික නොවන භාණ්ඩ** | | | | | | |
| ඉදල් .. | – | 2,257·00 | – | 1,597·00 | – | 479 |
| මයිකා .. | 49,651·13 | 45,378·50 | 27,707·81 | 28,690·92 | 8,311 | 8,606 |
| දුම්කොළ .. | – | 1890,977·54 | – | 1764,170·79 | – | 529,245 |
| ලී කැටයම් .. | 8,034·70 | 78,229·49 | 6,918·14 | 77 839·84 | 2,075 | 21,268 |
| එකතුව .. | 57,685·83 | 2016,842·53 | 34·625·95 | 1872,298·55 | 10,386 | 559·598 |
| මුළු එකතුව .. | 1377,589·37 | 5110,186·28 | 1303,680·09 | 4672,603·94 | 264,022 | 881,442 |

1967 දී අපනයන බෝනස් වවුචර් වලට නිකුත් කරන ලද ආනයන බලපත්‍ර වල මුළු වටිනාකම රුපියල් 570,526 කි. නිකුත් කළ බලපත්‍ර යටතේ මෙරට ආනයනය කළ ප්‍රධාන භාණ්ඩ නම්, පිගන් බඩු, පිරිසි කෝප්ප සහ මාළු දමන දීසි, රුපියල් දහස් 84·7, විදුරු තඹලේරු රුපියල් දහස් 54·8, කෑම් බිම් උපකරණ (හැඳි, ගෑරුප්පු හා පිහියා) රුපියල් දහස් 30·5, බයිසිකල් අමතර කොටස් රු. දහස් 58·4, සපත්තු අවචු රුපියල් දහස් 16·8, විදුලි යන්ත්‍ර කොටස් රුපියල් දහස් 13·5, වතුර පොම්ප රුපියල් දහස් 56·0, රෙදි වියන යන්ත්‍ර රුපියල් දහස් 78·8, බඩු ගෙන යන ගොවිපල වාහන රුපියල් දහස් 33.6 සහ දත් මදින බෙහෙත් පියුබ් රුපියල් දහස් 33·6, යනාදියයි.

නිරුබදු

අපනයන බදු

අපනයන තීරු බදු වල පහත දැක්වෙන වෙනස්කම් වර්ෂය තුළදී කරනලදී

67.3.29 – මිනිරන්, පැපොල් කිරි (සුදු හා දුඹුරු) ග්ලිසරල් (ග්ලිසරින් වගී ඇතුළුව) සහ ශුද්ධ නොකල ග්ලිසරින් වලට පනවා තිබුණ තරුබදු අත්හිටවන ලදී.

67.11.23 – (අ) තේ රාත්තල් 100 කට රුපියල් 35·00 පැවති අපනයන බද්ද, රුපියල් 5 කින් වැඩි කොට රුපියල් 40 ක් කරන ලදී.

(ආ) කොකෝ (අමු) රාත්තල් 100 කට රුපියල් 15 ව පැවති අපනයන බද්ද, රුපියල් 25 කින් වැඩි කොට රුපියල් 40 කරන ලදී.

(ඈ) කුරුළු පොතු රාත්තල් 100 කට රුපියල් 15 ව පැවති අපනයන බද්ද, රුපියල් 35 කින් වැඩි කොට රුපියල් 50 ක් කරන ලදී.

(ඈ) දැනට පවත්නා අනුක්‍රම පරිමාන බදු ක්‍රමය යටතේ ගෙවිය යුතු බදු වලට අමතරව, සෑම වර්ගයකම රබර් සඳහා රාත්තලකට ශත 0·03 ක බද්දක් පනවන ලදී.

(ඉ) එක්සත් ජනපද ඩොලරයට දැනට පවතින විනිමය අනුපාතිකය පදනම් කොට, පොල් නිෂ්පාදනය සඳහා නව අනුක්‍රම පරිමාන අපනයන බදු ක්‍රමයක් ඇති කරන ලදී.

ගෙවිය යුතු අවම හා උපරිම බදු වල විස්තර පහත දක්වා ඇත.

| ප්‍රධාන රේගු අයකැමි විසින් ඇස්තමේන්තු කොට දක්වා ඇති පරිදි පිලිපීන කොප්පරා සඳහා පවතින සාමාන්‍ය ලන්ඩන් මි. ර. ගැ. මිළ | ටොන් එකකට ගෙවිය යුතු අපනයන බදු | | | අළුත් පොල් සඳහා ගෙඩි 1000 කට ගෙවිය යුතු අපනයන බදු ප්‍රමාණය |
|---|---|---|---|---|
| | කොප්පරා | පොල්තෙල් | කපාපු පොල් | |
| රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 620·00 — ඉන් ඉහළ | 115·00 | නැත. | නැත. | 28·75 |
| 620·00 — | 115·00 | නැත. | නැත. | 28·75 |
| 620·00 නමුත් 630 ට නොවැඩි ඉන් ඉහළ | 117·93 | 4·76 | 4·04 | 29·48 |
| 1750·00 නමුත් 1760 ට නොවැඩි† ඉන් ඉහළ | 680·54 | 918·91 | 780·56 | 169·95 |

† ගැසට් ප්‍රකාශනයෙන් දැනුම් දී ඇති උපරිම මිළ පරාසය.

## ආනයන බදු

67–5–11 [2] කෘෂිකාර්මික උපකරණ, ට්‍රැක්ටර්, අමු ද්‍රව්‍ය, සහ සමහර කර්මාන්ත යන් සඳහා අවශ්‍ය වන යන්ත්‍ර සූත්‍ර හා අමතර කොටස් වෙනුවෙන් සහනදායක අපනයන බද්දක් දෙනු ලැබිය. ඉහත කී ආනයන සඳහා, සංවර්ධන අධ්‍යක්ෂක තුමාගෙන් ඒවා දේශීය කාර්මික සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය බව දක්වන සහතික කිරීමක් අවශ්‍ය වුණි.

## ආනයන බලපත්‍ර ගාස්තු

1967/68 මුදල් වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයෙන්, කලින් සිට වට්නාකමින් සියයට 1 බලපත්‍ර ගාස්තු ගෙවූ (සියයට 10 ක බලපත්‍ර ගාස්තු අය කල රෙදි පිළි වලට හැර) කිරි සහ කිරි ආහාර, ළදරුවන්ගේ හා දුර්වලයන්ගේ ආහාර, කපුනූල්, ඖෂධ හා බෙහෙත් වර්ග, පෝර වර්ග, භූමිතෙල්, මුද්‍රන කඩදාසි, උදළු සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වූ අනෙකුත් කුඩා උපකරණ යන භාණ්ඩ වලට හැර අන් සියළුම භාණ්ඩ සඳහා අය කළ බලපත්‍ර ගාස්තුව සියයට 1 සිට සියයට 10 දක්වා වැඩි කරන ලදී. ආහාර කොමසාරිස් වරයාගේ දෙපාර්තමේන්තුව ඇතුළු අනෙක් සියළුම දෙපාර්තමේන්තු, සියළු අපනයන බලපත්‍ර ගාස්තු වලින් සම්පූර්ණයෙන් නිදහස් කරන ලදී. මෙම විධිවිධානය මගින් රුපියල් දශ ලක්ෂ 80 ක අතිරේක අයභාරයක් ලබාගත හැකි වේ යැයි ඇස්තමේන්තු කරන ලදී.

---

2 ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රය – 1967 මැයි 11 නො. 14,747.

[1] 1967 සැප්තැම්බර් 4 දින තෝරාගන්නා ලද සමහර භාණ්ඩ වර්ග සඳහා වූ ආනයන බලපත්‍ර ගාස්තුව සංශෝධනය කරන ලදී. ඒවායේ විස්තර මෙසේය:-

**බලපත්‍ර ගාස්තුව රුපියල්**

(1) කිරි සහ යොදය (වාෂ්ප කළ හා උකු කළ කිරි ඇතුළු) ළදරු හා දුර්වලයන්ගේ ආහාර, කපුනූල්, ඖෂධ හා බෙහෙත් වර්ග, පෝර වර්ග, භූමිතෙල්, මුද්‍රණ කඩදාසි, උදළු සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වූ අනෙකුත් උපකරණ ආනයනය පිණිස දුන් බලපත්‍ර වල වටිනාකම්:-

| | |
|---|---|
| රුපියල් 500 ට වැඩි නොවූ | 5 |
| රුපියල් 500 ට වැඩි නමුත් රුපියල් 1,000 ට වැඩි නොවන | 10 |
| රුපියල් 1,000 ඉක්මවන සෑම රුපියල් 1,000 කට හෝ ඉන් කොටසකට | 10 |

(2) ආනයන සඳහා බලපත්‍ර -

| | |
|---|---|
| (අ) විශේෂයෙන්ම අභ්‍යන්තර වෙළඳාම සඳහා ආනයනය කරන කාර්මික ඉන්ධන තෙල්, නාවික ඩීසල් තෙල්, ගෑස් තෙල් සහ නාවික ලිහිස්සි තෙල් | එවැනි භාණ්ඩවල වටිනාකමින් සියයට 1 ක් |
| (ආ) අහස් යාත්‍රා සඳහා නිකුත් කළ අහස් නැව් ටර්බන තෙල්, අහස් නැව් ග්ලිසරින් සහ අහස් නැව් ලිහිස්සි තෙල් | එවැනි භාණ්ඩවල වටිනාකමින් සියයට 1 ක් |

**වෙළෙඳ සහ/හෝ ගෙවීම් ගිවිසුම්**

**මහජන චීන සමූහාණ්ඩුව**

1967 අවසානයේ දී වලංගු බව අවසන් වූ ගිවිසුම වෙනුවට, 1968 ජනවාරි 1 වැනිදසින් වන වර්ෂ පහක කාලච්ඡේදයන් සඳහා මහජන චීන සමූහාණ්ඩුව සමග 1967 නොවැම්බර් 6 වැනි දින වෙළෙඳාම් සහ ගෙවීම් ගිවිසුමක් අත්සන් කරන ලදී. සෑම වර්ෂයක ම ඔක්තෝබර් අවසානයට පෙර, ඊළඟ වර්ෂයේ දී හුවමාරු කර ගන්නා භාණ්ඩයන් සම්බන්ධයෙන් ප්‍රථම ලේඛන සකස් කිරීමට මෙම ගිවිසුමෙන් ඉඩ සලසා දී ඇත. මෙම දිනයේ දීම අත්සන් කරන ලද 1968 සඳහා වූ ප්‍රථම ලේඛන අනුව රටවල් දෙකම රුපියල් දශ ලක්ෂ 174 ක වටිනාකමකින් යුතු අපනයන හුවමාරු කර ගැනීමට ගිවිස ගන්නා ලදී. එහි ඇතුළත් වූ විශේෂ බැඳීම වූයේ රුපියල් දශ ලක්ෂ 150 ක නිවිටු වටිනාකමකින් යුත් ෂීට් රබර් මෙට්‍රික් ටොන් 75, 000 ක් ලංකාවෙන් යැවීමට හා එම වටිනාකමට නිවිටු ප්‍රමාණයකින් යුත් සහල් මෙට්‍රික් ටොන් 2,00,000 ක් චීනයෙන් එවීමට ද කතිකා කර ගැනීමයි.[2]

**බල්ගේරියානු මහජන සමූහාණ්ඩුව**

1961 මැයි 15 වැනිද අත්සන් තබන ලද වෙළඳ හා ගෙවීම් ගිවිසුම් රාමුව තුළ ම, 1968 සඳහා ස්වයං තුලන ක්‍රමය පදනම් කොට ගෙන බල්ගේරියානු මහජන සමූහාණ්ඩුව සමග භාණ්ඩ හුවමාරු කිරීම සඳහා මූලික ලියකියවිලි වලට 1967 නොවැම්බර් 6 වැනිද අත්සන් තබන ලදී. පවුම් දහස් 540 ක වටිනාකමින් යුතු, තේ, කොකෝවා, පොල් තෙල්, රබර් ෂීට් නො. 1 හා නො. 2 යන ද්‍රව්‍ය ලංකාවෙන්

---

1 1967 සැප්තැම්බර් 4 දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය (අති විශේෂ) අංක: 14,764/6.

2 මෙකී වෙළෙඳ ගිවිසුම් හැර ලංකාව තවත් රටවල් කිහිපයක් සමග වෙළෙඳාම් නැතහොත් ගෙවුම් ගිවිසුම් කිපයක් ම පවත්වා ගන්නා ලදී.

අපනයනය කිරීමටත් ඒ හා සමාන වටිනාකමක් ඇති තිරිඟු, ඉංජිනේරු භාණ්ඩ, රෝග නාශක බෙහෙත්, සහ යූරියා බල්ගේරියානු මහජන සමූහාණ්ඩුවෙන් අපනයනය කිරීමට ද මෙම කෙටුම්පතේ කොන්දේසි අනුව තීරණය කෙරිනි.

**සෝ. ස ස. සං. ය**

1965-1967 කාලය තුළදී සෝ. ස. ස. සං. ය. හා ලංකාව අතර, භාණ්ඩ හුවමාරු කර ගැනීම පිණිස, 1964 ඔක්තෝබර් 1 වැනි ද අත්සන් කළ ගිවිසුම් රාමුව තුළම, 1967 සඳහා දෙරට අතර, භාණ්ඩ හුවමාරු කරගැනීම පිණිස, අවශ්‍ය ලියකියවිලි 1966 දෙසැම්බර් 22 වැනිද හුවමාරු කරගන්නා ලදී.

**පකිස්ථානු ඉස්ලාම් සමූහාණ්ඩුව**

දෙරට අතර වෙළඳ සම්බන්ධතා බලවත් කර ගැනීම සඳහා 1955 දී අත්සන් තැබූ වෙළෙඳ ගිවිසුමේ කොන්දේසි අනුව, 1967 අප්‍රේල් 28 වැනිද පකිස්ථානු ඉසලාම් සමූහ.ණ්ඩුව සමග ගිවිසුම් මුල් කෙටුම්පතකට අත්සන් තබන ලදී. දෙරට අතර, දැනට පවතින සාමාන්‍ය වෙළෙඳාමට අවහිර නොවන ලෙස, ස්වයං තුලන පදනමක් යටතේ, රුපියල් දශ ලක්ෂ 3 ක වටිනාකමක් ඇති භාණ්ඩ හුවමාරු කර ගැනීමට මෙම නව ගිවිසුම මගින් ඉඩ සැලසේ. ගිවිසුම වර්ෂයක කාලපේදයකට වලංගු වන අතර, ආණ්ඩුවල අන්‍යොන්‍ය එකඟතාවයකින් එම කාලපේදය දීගු කිරීමට එහි ඉඩ සලසා ඇත.